# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ගුවන් ප්‍රවාහන

**ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහනය සඳහා වන ඇතැම් රීති එක්කිරීම සඳහා වන සම්මුතියට බලාත්මකභාවයක් ලබා දීම පිණිස සහ ඊට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.**

---

ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමා විසින් 2018 අගෝස්තු මස 24 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2018 ජුනි මස 29 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[262 වන පනත් කෙටුම්පත]**


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 45.00** **තැපැල් ගාස්තුව : රු. 20.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ගුවන් ප්‍රවාහන

එල්.ඩී.—ඕ 35/2012

**ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහනය සඳහා වන ඇතැම් රීති එක් කිරීම සඳහා වන සම්මුතියට බලාත්මකභාවයක් ලබා දීම පිණිස සහ ඊට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

පූර්විකාව.

වර්ෂ එක් දහස් නවසිය අනූ නවයේ මැයි මස විසිඅට වන දින මොන්ට්‍රියල් හි දී ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහනය සඳහා වන ඇතැම් රීති එක් කිරීම සඳහා සම්මුතියක් ඇති කරගෙන ඇති හෙයින් ද:

ඉහත කී සම්මුතියට එකඟ වීමට ශ්‍රී ලංකාව අදහස් කරන හෙයින් ද:

ඉහත කී සම්මුතිය යටතේ ශ්‍රී ලංකාව සතු වගකීම්වලට බලාත්මකභාවයක් ලබා දීමට නීතිමය විධිවිධාන සකස් කිරීමට අවශ්‍යව ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

1. මේ පනත 2018 අංක      දරන ගුවන් ප්‍රවාහන පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර 1999 මැයි මස 28 වන දින මොන්ට්‍රියල් හි දී පිළිගත් (මෙහි මින් මතු "සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහනය සඳහා වන ඇතැම් රීති එක් කිරීම සඳහා වූ සම්මුතිය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බලාත්මක වීම ආරම්භ වූ දිනය ලෙස අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මඟින් සහතික කරනු ලබන යම් දිනයක දී එය ක්‍රියාත්මක විය යුතු ය.

ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහනය සඳහා වන ඇතැම් රීති එක් කිරීම සඳහා වන සම්මුතියේ විධිවිධාන ශ්‍රී ලංකාවට අදාළ කරගැනීම.

2. සම්මුතියේ විධිවිධාන වන්නා වූ මේ පනතේ උපලේඛනයේ ඇතුළත් වන වගන්තීන්, ප්‍රවාහකයන්ගේ, ගුවන් මගීන්ගේ, බඩු යවන්නන්ගේ, බඩු ලබන්නන්ගේ සහ වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම් සහ වගකීම්වලට අදාළ වන ප්‍රමාණයට සහ මේ පනතේ විධිවිධානවලට යටත්ව, සම්මුතියට අදාළ වන යම් ගුවන් ප්‍රවාහනයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, ඒ ප්‍රවාහනය සිදුකරන ගුවන් යානයේ ජාතිකත්වය නොසලකා ශ්‍රී ලංකාවේ නීතිය තුළ බල පැවැත්විය යුතු ය.

**වෙන් කර තැබීම සහ පාර්ශ්ව රාජ්‍යයන් පිළිබඳ නිවේදනය.**

**3.** (1) අමාත්‍යවරයා විසින් කලින් කලට *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නිවේදනයක් මඟින් තැන්පතුධාරියා වෙත ප්‍රකාශ කරනු ලැබිය හැකි සම්මුතියේ 57 වන වගන්තිය යටතේ වන යම් වෙන් කර තැබීමක් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් කලින් කලට *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියමයක් මඟින් සම්මුතියේ පාර්ශ්ව රාජ්‍යයන් සහ සම්මුතියේ පාර්ශ්ව රාජ්‍යයන්ගේ දේශ සීමා සහ එම පාර්ශ්ව රාජ්‍යයන් විසින් සිදු කළ වෙන් කර තැබීම සහ පාර්ශ්වීය නොවන රාජ්‍යයන්ගේ දේශ සීමා ඇතුළත ගිවිසගත් නැවතුම් ස්ථාන පිළිබඳ දැනුම් දෙනු ලැබිය හැකි ය.

**හානිපූර්ණය සඳහා නඩු පැවරීම.**

**4.** යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, සම්මුතියේ විධිවිධානවලට සහ එහි දක්වා ඇති වගකීම්වල යම් සීමාවන්ට යටත්ව හැර යම් ගිවිසුමක් යටතේ හෝ තෝරතයක් යටතේ හෝ අන්‍යාකාරයකට ප්‍රවාහකයකුට එරෙහිව හානිපූර්ණය සඳහා කිසිදු නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය.

**සම්මුතිය වෙනස් කිරීම.**

**5.** (1) මේ පනතේ උපලේඛනයේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එහි දක්වා ඇති පරිදි ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහනයක් නොවන්නා වූ යම් ගුවන් ප්‍රවාහනයකට අදාළ කර ගනු ලැබිය යුතු ය.

(2) 1992 අංක 55 දරන ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනතේ (වෝර්සෝ - හේග් ගුවන් ප්‍රවාහන සම්මුතියේ) II වන කොටසේ කිසිවක් සම්මුතිය අදාළ වන කිසිදු ගුවන් ප්‍රවාහනයක් සම්බන්ධයෙන් අදාළ කර නොගත යුතු ය.

**සීමා සංශෝධනය කිරීම.**

**6.** සම්මුතියේ 24 වන වගන්තිය යටතේ යම් සීමා ප්‍රතිශෝධනයකට අදාළ යම් නිවේදනයක් ලැබුන පසුව අමාත්‍යවරයා විසින් කලින් කලට *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මඟින් තැන්පතුධාරියා විසින් සමාලෝචනය කරනු ලැබිය හැකි පරිදි වූ වගකීම්වලට සීමාවන් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ය.

**කලින් ගෙවීම්.**

**7.** ගුවන් මගියකුට මරණය හෝ තුවාල සිදු වන ගුවන් යානා අනතුරක් සම්බන්ධයෙන්, ප්‍රවාහකයා විසින් සම්මුතියේ 28 වන වගන්තිය මඟින් විධිවිධාන සලසා ඇති පරිදි කලින් ගෙවීම සිදුකරනු ලැබිය යුතු ය.

**8.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි - 

අර්ථ නිරූපණය.

"අමාත්‍යවරයා" යන්නෙන් සිවිල් ගුවන් සේවා විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ.

**9.** මේ පනතෙහි සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**උපලේඛනය**

(2 වන වගන්තිය)

**ගුවන් මඟින් සිදු කරනු ලබන අන්තර්ජාතික ප්‍රවාහනය සඳහා වන ඇතැම් රීති එක් කිරීම සඳහා වන සම්මුතිය (1999 මැයි මස 28 වන දින මොන්ට්‍රියෙල් හි දී)**

**I වන පරිච්ඡේදය**

පොදු විධිවිධාන

**1 වන වගන්තිය - අදාළ වන විෂය ක්ෂේත්‍රය**

1. ගුවන් යානා මඟින් පුද්ගලයන්, ගමන් බඩු හෝ බඩු අන්තර් ජාතිකව ප්‍රවාහනය කිරීමේ දී ඇතිවන ප්‍රතිඵලයන් සම්බන්ධයෙන් මේ සම්මුතිය අදාළ වේ. එය ගුවන් ප්‍රවාහන ව්‍යාපාරයක් විසින් නොමිලයේ ඉටු කරන ගුවන් යානා මඟින් සිදු කරනු ලබන ප්‍රවාහනවලට ද ඒ හා සමානවම අදාළ වන්නේ ය.

2. මේ සම්මුතියේ කාර්ය සඳහා "අන්තර්ජාතික ප්‍රවාහනය" යන යෙදුමෙන් ප්‍රවාහනයෙහි කැඩීමක් හෝ අන්තර්යානාගත කිරීමක් සිදු වුව ද නැතහොත් එසේ සිදු නොවුව ද පාර්ශ්වකරුවන් අතර එකඟවීමට අනුව, ගමනාරම්භක ස්ථානය සහ ගමනාන්ත ස්ථානය ප්‍රධාන ගිවිසුම්කාර රාජ්‍ය පාර්ශ්වයන්ගේ දේශසීමා ඇතුළත පිහිටා ඇත්තා වූ හෝ ප්‍රධාන ගිවිසුම්කාර පාර්ශ්වයක් නොවන්නේ වී නමුත් වෙනත් රාජ්‍යයක් තුළ එකඟ වූ නැවතුම් ස්ථානයක් පිහිටා ඇති, ප්‍රධාන ගිවිසුම්කාර එක් පාර්ශ්වයක දේශසීමා ඇතුළත ගමනාරම්භක ස්ථානය සහ ගමනාන්තය පිහිටා ඇත්තා වූ යම් ප්‍රවාහනයක් අදහස් වේ. පාර්ශ්වයන් නොවන වෙනත් රාජ්‍යයක දේශසීමාව ඇතුළත එකඟ වූ නැවතුම් ස්ථානයක් නොමැති ප්‍රධාන ගිවිසුම්කාර තනි පාර්ශ්වයක දේශසීමා ඇතුළත පමණක් ස්ථාන දෙකක් අතර සිදු කරනු ලබන ප්‍රවාහනය මේ සම්මුතියේ කාර්ය සඳහා අන්තර්ජාතික ප්‍රවාහනයක් නොවන්නේ ය.

3. ප්‍රවාහකයන් කිහිප දෙනෙකු විසින් අනුක්‍රමිකව ඉටුකළ යුතු ප්‍රවාහනයක් සඳහා තනි ගිවිසුමක ස්වරූපය යටතේ හෝ ගිවිසුම් මාලාවක ස්වරූපය යටතේ හෝ එකඟ වී තිබුණ ද එය තනි ක්‍රියාවක් ලෙස පාර්ශ්වකරුවන් විසින් සලකනු ලැබ ඇත්නම්, ඒ ප්‍රවාහනය මේ සම්මුතියේ කාර්ය සඳහා එක් අඛණ්ඩ ප්‍රවාහනයක් ලෙස සලකනු ලබන අතර එකී ගිවිසුමක් හෝ ගිවිසුම් මාලාවක් හෝ හුදෙක් එකම රාජ්‍යයේ දේශසීමා ඇතුළත මුලුමනින්ම ඉටුකළ යුතු ව තිබීමේ හේතුවෙන් ම අන්තර්ජාතික ලක්ෂණ ඊට අහිමි නොවේ.

4. V වන පරිච්ඡේදයේ ඇතුළත් නියමයන්ට යටත්ව, එහි දක්වා ඇති ප්‍රවාහනයකට ද මෙම සම්මුතිය අදාළ වේ.

**2 වන වගන්තිය - රාජ්‍ය විසින් ඉටු කරන ප්‍රවාහනය හෝ තැපැල් භාණ්ඩ ප්‍රවාහනය**

1. 1 වන වගන්තියේ දක්වා ඇති කොන්දේසිවලට තුළට ගැනෙන, රාජ්‍යයන් විසින් ඉටුකරන ප්‍රවාහනයකට හෝ නීතිය අනුව සංස්ථාපිත රාජ්‍ය ආයතන විසින් ඉටුකරන ප්‍රවාහනයක හෝ මෙම සම්මුතිය අදාළ වේ.

2. තැපැල් භාණ්ඩ ප්‍රවාහනයේ දී, ප්‍රවාහකයන් සහ තැපැල් පරිපාලනය අතර සම්බන්ධතාවය ට අදාළ රීතිවලට අනුකූලව අදාළ තැපැල් පරිපාලනයට පමණක් ප්‍රවාහකයා යටත් විය යුතු ය.

3. මේ වගන්තියේ 2 වන ඡේදයේ දක්වා ඇති විධිවිධාන පරිදි හැර, මේ සම්මුතියේ විධිවිධාන තැපැල් භාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

## II වන පරිච්ඡේදය

### මගීන්, ගමන් බඩු සහ බඩු ප්‍රවාහනය කිරීමට අදාළ වන පාර්ශ්වයන්ගේ තොරතුරු ලේඛන සහ කාර්ය

**3 වන වගන්තිය - මගීන් සහ ගමන් බඩු**

1. මගීන් ප්‍රවාහනය සම්බන්ධයෙන් තනි හෝ සාමූහික ප්‍රවාහන ලේඛන-

(අ) ගමනාරම්භක ස්ථානය සහ ගමනාන්ත ස්ථානයන් පිළිබඳ දැක්වීමක්;

(ආ) එක් රාජ්‍ය පාර්ශ්වයක දේශසීමාව තුළ ගමනාරම්භක ස්ථානය සහ ගමනාන්ත ස්ථාන පිහිටා ඇති විට එකඟ වූ නැවැත්වීමේ ස්ථාන එකක් හෝ ඊට වැඩි ගණනක වෙනත් රාජ්‍යයක දේශසීමා තුළ පිහිටා ඇත්නම් අවම වශයෙන් එවැනි එක් නැවැත්වීමේ ස්ථානයක් පිළිබඳව දැක්වීමක්,

ඇතුළත් කරමින් භාර දිය යුතු ය.

2. 1 වන ඡේදය යටතේ දක්වන ලද තොරතුරු ආරක්ෂා කරන වෙනත් යම් ක්‍රමයක් එම ඡේදයේ සඳහන් කරන ලද ලේඛන බෙදා හැරීම සඳහා ආදේශ කරගනු ලැබිය හැකි ය. එවැනි යම් ක්‍රමයක් භාවිතා කරන්නේ නම්, ප්‍රවාහකයා විසින් එසේ සුරක්ෂිත කරන ලද තොරතුරුවල ලිඛිත ප්‍රකාශයක් මගියාට ලබා දීමට කටයුතු කළ යුතු ය.

3. පරීක්ෂා කරන ලද එක් එක් ගමන් බඩු වෙනුවෙන්, ගමන් බඩු හඳුනාගැනීමේ ලේබලයක් ප්‍රවාහකයා විසින් මගියාට ලබා දිය යුතු ය.

4. මෙම සම්මුතියේ පාලනය අදාළ වන අවස්ථාවක දී, එහි අදාළත්වය පිළිබඳ ලිඛිත දැන්වීමක් මගියාට ලබා දිය යුතු අතර, මගියකුගේ මරණය හෝ

තුවාල සිදුවීමක් සම්බන්ධයෙන් සහ ගමන් බඩු විනාශ වීමක් හෝ නැතිවීමක් හෝ හානිවීමක් වෙනුවෙන් සහ එම බඩු ප්‍රමාද වීම වෙනුවෙන් ප්‍රවාහකයන්ගේ වගකීම් සීමා කරනු ලැබිය හැකි ය.

5. කලින් සඳහන් කල ඡේදයන් හි විධිවිධානවලට අනුකූල නොවීම, ප්‍රවාහන ගිවිසුමේ පැවැත්මට හෝ වලංගුභාවයට බල නොපෑ යුතු නමුත් වගකීම් සීමා කිරීමට අදාළ වන රීති ද ඇතුළුව මේ සම්මුතියේ රීතිවලට යටත් විය යුතු ය.

4 වන වගන්තිය - බඩු

1. බඩු ප්‍රවාහනය සම්බන්ධයෙන් ගුවන්වේ බිල්පතක් ලබා දිය යුතු ය.

2. ප්‍රවාහනය සිදු කළ යුතු ආකාරයේ වාර්තාවක්, සංරක්ෂණය කිරීම සඳහා වන වෙනත් යම් ක්‍රමයක් ගුවන්වේ බිල්පතක් භාරදීම සඳහා ආදේශ කර ගනු ලැබිය හැකි ය. එවැනි යම් වෙනත් ක්‍රමයක් භාවිතා කරන්නේ නම්, බඩු යවන්නා විසින් එසේ ඉල්ලීම් කර ඇත්නම් ප්‍රවාහකයා විසින් බඩු යවන්නා වෙත, භාරදුන් බඩු හඳුනාගැනීම සඳහා සහ වෙනත් යම් ක්‍රමයක් මඟින් සංරක්ෂණය කරන ලද වාර්තාවක ඇතුළත් කරන ලද තොරතුරුවලට ප්‍රවේශ වීමට අවසර දෙමින් බඩු ලදු පතක් භාර දිය යුතු ය.

5 වන වගන්තිය - ගුවන්වේ බිල්පතක හෝ බඩු ලදුපතක අන්තර්ගතයන්

ගුවන්වේ බිල්පතක හෝ බඩු ලදුපතක -

(අ) ගමනාරම්භක ස්ථානය සහ ගමනාන්ත ස්ථානය පිළිබඳ දැක්වීමක්;

(ආ) ගමනාරම්භක ස්ථානය සහ ගමනාන්ත ස්ථානය එකම රාජ්‍ය පාර්ශ්වයක දේශසීමා ඇතුළත පිහිටා ඇත්නම් ද, එකඟ වූ නතර වන ස්ථාන එකක් හෝ වැඩි සංඛ්‍යාවක් වෙනත් රාජ්‍යයක දේශසීමා ඇතුළත පිහිටා ඇත්නම් ද යටත් පිරිසෙයින් ඒ නතර වන එක් ස්ථානයක් පිළිබඳ දැක්වීමක්; සහ

(ඇ) බඩුවල බර පිළිබඳ දැක්වීමක්,

ඇතුළත් කළ යුතු ය.

6 වන වගන්තිය - බඩුවල ස්වභාවයට අදාළ ලේඛන

අවශ්‍ය නම් රේගුව, පොලිසිය හා ඒ හා සමාන රාජ්‍ය අධිකාරීන් හි නියමයන් සම්පූර්ණ කිරීම සඳහා බඩුවල ස්වභාවය දක්වන ලේඛනයක් භාරදෙන ලෙස බඩු යවන්නා වෙත නියම කරනු ලැබිය හැකි ය. මේ විධිවිධාන මඟින් බඩු සම්බන්ධයෙන් ප්‍රවාහකයාට කිසිදු යුතුකමක්, බැඳීමක් හෝ වගකීමක් ඇති නොකරයි.

**7 වන වගන්තිය - ගුවන්වේ බිල්පතක විස්තර**

1. බඩු යවන්නා විසින් මූලික කොටස් තුනකින් යුක්තව ගුවන්වේ බිල්පතක් සකස් කළ යුතු ය.

2. පළමු කොටසේ "ප්‍රවාහකයා සඳහා" යනුවෙන් සඳහන් කළ යුතු ය; තවද, එම කොටස බඩු යවන්නා විසින් අත්සන් කළ යුතු ය. දෙවන කොටස "බඩු ලබන්නා සඳහා" යනුවෙන් සඳහන් කළ යුතු ය. එම කොටස බඩු යවන්නා සහ ප්‍රවාහකයා විසින් අත්සන් කළ යුතු ය. තුන්වන කොටස බඩු භාරගැනීමෙන් පසුව බඩු යවන්නා වෙත එය භාරදිය යුතු වන්නේ යම් ප්‍රවාහකයකු විසින් ද ඒ ප්‍රවාහකයා විසින් අත්සන් කළ යුතු ය.

3. ප්‍රවාහකයාගේ සහ එම බඩු යවන්නාගේ අත්සන මුද්‍රිත හෝ මුද්‍රා තබන ලද එකක් විය හැකි ය.

4. බඩු යවන්නාගේ ඉල්ලීමක් මත ගුවන්වේ බිල්පත ප්‍රවාහකයා විසින් සකස් කර ඇත්නම්, ඔප්පු කිරීමකට පටහැනිවීමට යටත්ව බඩු යවන්නා වෙනුවෙන් ප්‍රවාහකයා විසින් එසේ සිදුකර ඇති බවට සලකනු ලැබිය යුතු ය.

8 වන වගන්තිය - බහුවිධ ඇසුරුම් සඳහා වූ තොරතුරු

එක ඇසුරුමකට වඩා වැඩිවන විට දී-

(අ) වෙන් වෙන් වශයෙන් වූ ගුවන්වේ බිල්පත් සකස් කරන ලෙස බඩු යවන්නා හට නියම කිරීමට බඩු ප්‍රවාහකයාට අයිතිය තිබිය යුතු ය;

(ආ) 4 වන වගන්තියේ 2 වන ඡේදයේ සඳහන් කරන ලද වෙනත් ක්‍රමයක් භාවිතා කරන අවස්ථාවක දී වෙන් වෙන් වශයෙන් බඩු ලදු පතක් භාරදෙන ලෙසට ප්‍රවාහකයාට නියම කිරීමට බඩු යවන්නාට අයිතිය තිබිය යුතු ය.

**9 වන වගන්තිය - ලේඛනගත නියමයන්ට අනුකූල නොවීම.**

4 වන වගන්තියේ සිට 8 වන වගන්තිය දක්වා වූ විධිවිධාන සමඟ අනුකූල නොවීම ප්‍රවාහන ගිවිසුමේ පැවැත්මට හෝ වලංගුභාවයට බල නොපෑ යුතු නමුත් වගකීම් සීමාකිරීමට අදාළ වන රීති ද ඇතුළුව මේ සම්මුතියේ රීතිවලට යටත් විය යුතු ය.

10 වන වගන්තිය - ලේඛනගත කරුණු සඳහා වූ වගකීම

1. බඩු යවන්නා විසින් හෝ ඔහු වෙනුවෙන් කටයුතු කරන බඩු යවන්නකු විසින් ගුවන්වේ බිල්පතක ඇතුළත් කරන ලද හෝ බඩු යවන්නා විසින් හෝ ඔහු වෙනුවෙන් කටයුතු කරන බඩු යවන්නකු විසින් බඩු ලදුපතක ඇතුළත් කිරීම සඳහා ප්‍රවාහකයාට ලබා දෙන හෝ 4 වන වගන්තියේ 2 වන ඡේදයේ සඳහන් කරන ලද වෙනත් ආකාරයකින් සංරක්ෂණය කරන ලද වාර්තාවල

ඇතුළත් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද බඩුවලට අදාළ වන තොරතුරු සහ ප්‍රකාශනවල නිරවද්‍යතාවය වෙනුවෙන් බඩු යවන්නා වගකිව යුතු ය. බඩු යවන්නා වෙනුවෙන් ක්‍රියාකරන තැනැත්තා ප්‍රවාහකයාගේ අනුයෝජිතයකු වන අවස්ථාවක දී, කලින් සඳහන් කළ ප්‍රකාශය අදාළ කරගනු ලැබිය යුතු ය.

2. බඩු යවන්නා විසින් හෝ ඔහු වෙනුවෙන් කටයුතු කරන බඩු යවන්නකු විසින් සපයන ලද තොරතුරු සහ ප්‍රකාශනවල අක්‍රමවත්බව, සාවද්‍යභාවය හෝ අසම්පූර්ණභාවය හේතුවෙන් ප්‍රවාහකයාට හෝ ප්‍රවාහකයා වගකීමට යටත් වන්නේ යම් තැනැත්තකුට ද, එවැනි යම් තැනැත්තකු විසින් විඳීමට සිදුවන සියලු අලාභ හානි වෙනුවෙන් බඩු යවන්නා විසින් ප්‍රවාහකයාට හානිපූර්ණය කළ යුතු ය.

3. මේ වගන්තියේ 1 වන සහ 2 වන ඡේදවල විධිවිධානවලට යටත්ව, ප්‍රවාහකයා විසින් හෝ ඔහු වෙනුවෙන් කටයුතු කරන බඩු යවන්නකු විසින් බඩු ලදුපත්වල හෝ 4 වන වගන්තියේ 2 වන ඡේදයේ සඳහන් කරන ලද වෙනත් යම් ආකාරයකින් සංරක්ෂණය කරන ප්‍රකාශනවල ඇතුළත් කරන ලද තොරතුරුවල හෝ ප්‍රකාශනවල අක්‍රමවත්භාවය, සාවද්‍යභාවය හෝ අසම්පූර්ණභාවය හේතුවෙන් බඩු යවන්නා විසින් වගකීමට බැඳී සිටින්නේ යම් තැනැත්තකුට ද, එවැනි යම් තැනැත්තකු විසින් දරනු ලබන සියලු අලාභය වෙනුවෙන් ප්‍රවාහකයා විසින් බඩු යවන්නාට හානිපූර්ණය කළ යුතු ය.

### 11 වන වගන්තිය - තොරතුරුවල සාක්ෂිමය වටිනාකම්

1. ගිවිසුම අවසන් වූ බවට ද, බඩු භාර ගත් බවට ද, ප්‍රවාහනයේ දී දක්වන ලද කොන්දේසි සම්බන්ධයෙන් ද ගුවන්වේ බිල්පත හෝ බඩු ලදුපත බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් වන්නේ ය.

2. බඩුවල බර, පරිමාව සහ බඩු ඇසුරුම් කිරීමට අදාළව මෙන්ම ඇසුරුම් සංඛ්‍යාවට අදාළව ද ගුවන්වේ බිල්පතක හෝ ගුවන් බඩු ලදුපතක ඇතුළත් ප්‍රකාශන කිසිවක් එසේ ප්‍රකාශිත කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් වන්නේ ය. තව ද, බඩුවල ප්‍රමාණය, පරිමාව සහ තත්වයට අදාළ වන ප්‍රකාශ ගුවන්වේ බිල්පත හෝ බඩු ලදුපත ප්‍රවාහකයා විසින් බඩු යවන්නා ඉදිරිපිට දී හරිවැරදි බලා ඇත්නම් සහ එසේ බලන ලද බව ගුවන්වේ බිල්පතෙහි හෝ බඩු ලදුපතෙහි ප්‍රකාශ කර ඇත්නම් මිස හෝ ඒවා බඩුවල දෘශ්‍යමාන තත්වයට හා සම්බන්ධව නම් මිස, ඒ ප්‍රකාශනවල ප්‍රවාහකට එරෙහිව වූ සාක්ෂි සංයුක්ත නොවන්නේ ය.

### 12 වන වගන්තිය - බඩු බැහැර කිරීමේ අයිතිය

1. ප්‍රවාහන ගිවිසුම යටතේ බඩු යවන්නා විසින් තමාගේ සියලු බැඳීම් ඉටුකිරීමට ඇති වගකීමට යටත්ව, ගමනාරම්භක හෝ ගමනාන්තය සිදුවන ගුවන් තොටුපළෙ හි දී එම බඩු ආපසු ගැනීම මඟින් හෝ ගමන් කරන අවස්ථාවේ දී එය ගොඩබැස්සූ අවස්ථාවක එම බඩු නතර කර ගැනීමෙන් හෝ නම් කරන ලද තැනැත්තා නොවන වෙනත් තැනැත්තකුට ගමනාන්තය සිදුවන ස්ථානයේ දී හෝ ගමන් කරන අවස්ථාවේ දී එය භාරදීම සඳහා උපදෙස් දීම

මඟින් හෝ ගමනාරම්භක ගුවන් තොටුපළට ඒවා ආපසු දෙන ලෙස ඉල්ලා සිටීමෙන් හෝ එම බඩු නීයාදනය කිරීමට බඩු යවන්නාට අයිතිය ඇත්තේ ය. බඩු යවන්නා විසින් බඩු නීයාදනය කිරීමේ අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීමේ දී, ප්‍රවාහකයකුට හෝ වෙනත් බඩු යවන්නන්ට හෝ අගතියක් වන යම් ආකාරයකින් ක්‍රියාත්මක නොකළ යුතු අතර, මෙම අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීමේ දී සිදු කරන ලද යම් වියදම් කිසිවක් ඔහු විසින් ආපසු ගෙවනු ලැබිය යුතු ය.

2. බඩු යවන්නාගේ උපදෙස් ඉටුකිරීමට හැකියාවක් නොමැතිනම් ප්‍රවාහකයා විසින් ඒ පිළිබඳව නොපමාව බඩු යවන්නාට දැනුම් දිය යුතු ය.

3. පසුව භාර දිය යුතු ගුවන්වේ බිල්පතක හෝ බඩු ලදු පතෙහි කොටසක් ඉදිරිපත් කිරීමට නියම කිරීමෙන් තොරව බඩු යවන්නාගේ උපදෙස්වලට අනුව ප්‍රවාහකයා අවනත වී බඩු නීයාදනය කිරීම සඳහා ක්‍රියා කළහොත්, එකී ගුවන්වේ බිල්පතේ හෝ බඩු ලදුපතෙහි ඉහත සඳහන් කළ කොටසේ නීත්‍යානුකූල සන්තකය ඇති තැනැත්තාට එකී ක්‍රියාව මඟින් සිදුවිය හැකි හානි කිසිවක් සම්බන්ධයෙන් ප්‍රවාහකයා වගකිව යුතු ය. ප්‍රවාහකයාගේ එම වගකීමට බැඳී සිටීම බඩු යවන්නාගෙන් අයකර ගැනීමට ප්‍රවාහකයාට ඇති අයිතිවාසිකමට අගතියක් නොමැති විය යුතු ය.

4. 13 වන වගන්තියට අනුකූලව ක්‍රියා කිරීම ආරම්භ කරන අවස්ථාවේ දී බඩු යවන්නා වෙත පවරන ලද අයිතිවාසිකම් අවසන් වන්නේ ය. එසේ වුව ද, බඩු ලබන්නා බඩු භාරගැනීම ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ ඔහු හා සන්නිවේදනය කළ නොහැකි විට බඩු යවන්නාට ඇති නීයාදනය කිරීමේ අයිතිය තවදුරටත් පවත්වාගෙන යා හැක.

13 වන වගන්තිය - බඩු බෙදා හැරීම

1. 12 වන වගන්තිය යටතේ බඩු යවන්නා විසින් ස්වකීය අයිතිය ක්‍රියාත්මක කර ඇති විටක දී හැර, බඩු ගමනාන්ත ස්ථානයට ළඟා වූ විට නියමිත ගාස්තු ගෙවීමෙන් පසුව සහ ප්‍රවාහන කොන්දේසි අනුව කටයුතු කිරීමෙන් පසුව ගුවන් බඩු තමාට භාරදෙන ලෙසට ප්‍රවාහකට නියම කිරීමට බඩු ලබන්නාට හිමිකමක් ඇත්තේ ය.

2. අන්‍යාකාරයකින් ගිවිසගෙන ඇත්නම් මිස, බඩු ළඟා වූ වහාම බඩු ලබන්නා වෙත දැනුම් දීම ප්‍රවාහකගේ කාර්යය වන්නේ ය.

3. බඩු නැති වී ඇති බව ප්‍රවාහකයා පිළිගන්නේ නම් හෝ එම බඩු ළඟා විය යුතු දිනය පසුවී දින හතක් ඉකුත් වුව ද බඩු ළඟා වී නොමැති නම්, ප්‍රවාහන ගිවිසුම හා බැඳී පවතින තම අයිතිවාසිකම් ප්‍රවාහකයාට එරෙහිව බලාත්මක කිරීමට බඩු ලබන්නාට හිමිකමක් ඇත්තේ ය.

14 වන වගන්තිය - බඩු යවන්නාගේ සහ බඩු ලබන්නාගේ අයිතිවාසිකම් බලාත්මක කිරීම

බඩු යවන්නා සහ බඩු ලබන්නා විසින් ගිවිසුමෙන් නියම වී තිබෙන වගකීම් ඉටුකරන්නේ නම්, තමාගේ ප්‍රයෝජනය පිණිස ක්‍රියා කිරීමේ දී වුව ද හෝ

වෙනත් තැනැත්තකුගේ ප්‍රයෝජනය පිණිස ක්‍රියා කිරීමේ දී වුව ද, බඩු යවන්නා සහ බඩු ලබන්නා විසින් පිළිවෙළින් 12 වන සහ 13 වන වගන්තිවලින් එක් එක් තැනැත්තන් වෙත පැවරී ඇති සියලු අයිතිවාසිකම්, ඒ එක් එක් තැනැත්තා විසින් තම තමන්ගේ නමින් බලාත්මක කළ හැකි ය.

**15 වන වගන්තිය - බඩු යවන්නා සහ බඩු ලබන්නාගේ සබඳතා හෝ තුන්වන පාර්ශ්වයේ අන්‍යෝන්‍ය සබඳතා**

1. බඩු යවන්නා සහ බඩු ලබන්නා අතර ඇති සබඳතාව කෙරෙහි හෝ බඩු යවන්නාගේ හෝ බඩු ලබන්නාගෙන් ව්‍යුත්පන්න වන්නා වූ තුන්වන පාර්ශ්වකරුවන්ගේ අන්‍යෝන්‍ය සම්බන්ධතා කෙරෙහි 12 වන, 13 වන සහ 14 වන වගන්ති බල නොපායි.

2. 12 වන , 13 වන සහ 14 වන වගන්තිවල විධිවිධාන ගුවන්වේ බිල්පතේ හෝ බඩු ලදුපතේ ප්‍රකාශිත විධිවිධාන මඟින් පමණක් වෙනස් කළ හැකි ය.

**16 වන වගන්තිය - රේගුව,පොලිසිය හෝ වෙනත් රාජ්‍ය ආයතනවලට අවශ්‍ය විධිමත්භාවයන් ඉදිරිපත් කිරීම**

1. බඩු ලබන්නා වෙත බඩු භාරදෙනු ලැබීමට පෙරාතුව රේගුව, පොලීසිය සහ වෙනත් රාජ්‍ය ආයතනවලට කටයුතු විධිමත්ව  සපුරාලීමට අවශ්‍ය වන යම් තොරතුරු සහ යම් ලේඛන බඩු යවන්නා විසින් ඉදිරිපත් කළ යුතු ය. එවැනි යම් තොරතුරු හෝ ලේඛන ඉදිරිපත් නොකිරීම, ප්‍රමාණවත් නොවීම හෝ අවිධිමත්භාවය නිසා සිදුවන යම් හානි වෙනුවෙන්, එකී හානි ප්‍රවාහකයාගේ හෝ ඔහුගේ සේවකයකුගේ හෝ අනුයෝජිතයකුගේ වරදක් හේතුවෙන් සිදුවී ඇත්නම් මිස, බඩු යවන්නා විසින් එකී හානිය සඳහා ප්‍රවාහකට වගකීමට බැඳී සිටී.

2. එම තොරතුරුවල හෝ ලේඛනවල නිරවද්‍යතාවය හෝ ප්‍රමාණවත්භාවය පිළිබඳව විමසා බැලීමට ප්‍රවාහකයා කිසිදු බැඳීමකට යටත් නොවන්නේ ය.

## III වන පරිච්ඡේදය

ප්‍රවාහකයාගේ වගකීම් සහ හානි සඳහා වන්දි ප්‍රමාණයන්ගේ අදාළත්වය

**17 වන වගන්තිය - මගීන්ගේ මරණය සහ තුවාල වීම - ගමන් බඩුවලට හානි සිදුවීම**

1. ගුවන් යානය ඇතුළත දී හෝ ගුවන් යානයට නැගීමේ දී හෝ ගුවන් යානයෙන් බැසීමේ යම් ක්‍රියාවලියක් අතරවාරයේ දී යම් හදිසි අනතුරක ප්‍රතිඵලයක් වශයෙන් පමණක් යන කොන්දේසිය මත මගියෙකු මරණයට පත්වුවහොත් හෝ ශාරීරික තුවාල සිදු වුවහොත්, එකී මගියා මරණයට පත්වීමට හෝ ශාරීරික තුවාල සිදුවීම සම්බන්ධයෙන් තහවුරු කරන ලද හානියක් වෙනුවෙන් ප්‍රවාහකයා වගකීමට බැඳී සිටී.

2. ගුවන් යානය තුළ දී හෝ පරීක්ෂා කරන ලද ගමන් බඩු ප්‍රවාහකයා භාරයේ තිබූ යම් කාලසීමාවක් තුළ දී සිදු වූ විනාශ වීමක් හෝ නැතිවීමක් හෝ හානියක් වන අවස්ථාවක දී පමණක් යන කොන්දේසිය මත පරීක්ෂා කරන ලද ගමන් බඩු විනාශ වීමක් හෝ නැති වීමක් හෝ සිදුවූ හානියක් සම්බන්ධයෙන් තහවුරු කරන ලද හානියක් වෙනුවෙන් ප්‍රවාහකයා වගකීමට බැඳී සිටී. එසේ වුව ද, ගමන් බඩුවල ආවේණික දෝෂ තත්වයන් හෝ අඩුපාඩු මගින් එකී හානිය ඇතිවූයේ නම් එම හානිය සම්බන්ධයෙන් ප්‍රවාහකයා වගකීමට බැඳී නොසිටී. පුද්ගලික අයිතම ද ඇතුළුව පරීක්ෂා නොකරන ලද ගමන් බඩු සම්බන්ධයෙන් වූ හානියක දී ඒ හානිය ප්‍රවාහකයාගේ වරදකින් හෝ ඔහුගේ සේවකයන්ගේ හෝ අනුයෝජිතයන්ගේ වරදක් හේතුවෙන් සිදුවූයේ නම් ඒ සඳහා ප්‍රවාහකයා වගකීමට බැඳී සිටී.

3. පරීක්ෂා කරන ලද ගමන් බඩු නැති වූ බවට ප්‍රවාහකයා පිළිගන්නේ නම් හෝ පරීක්ෂා කරන ලද ගමන් බඩු ළඟාවිය යුතු ව තිබූ දිනය පසුවී දින විසි එකක් ඉකුත්ව ගිය නමුත් එකී බඩු ළඟාවී නොමැතිනම්, ප්‍රවාහන ගිවිසුම මත වූ අයිතිවාසිකම් අනුව ප්‍රවාහකට එරෙහිව බලාත්මක වීමට මගියා හිමිකම් ලබයි.

4. අන්‍යාකාරයකින් නිශ්චිතව සඳහන් කර නැත්නම් මිස, මේ සම්මුතියේ "ගමන් බඩු" යන්නෙන් පරීක්ෂා කරන ලද ගමන් බඩු සහ පරීක්ෂා නොකළ ගමන් බඩු අදහස් වේ.

### 18 වන වගන්තිය - බඩුවලට හානි සිදුවීම

1. ගුවන් මගින් ප්‍රවාහනය සිදු කරන කාලය තුළ දී පමණක් යම් තහවුරු කරන ලද හානියක් සිදු වූ බව යන කොන්දේසිය මත බඩු විනාශ වීමේ හෝ නැති වීමේ හෝ බඩුවලට හානියක් සිදුවන අවස්ථාවක දී තහවුරු කරන ලද අලාභය වෙනුවෙන් ප්‍රවාහකයා වගකීමට බැඳී සිටින්නේ ය.

2. එසේ වුව ද, පහත දැක්වෙන ෘ-

(අ) බඩුවල ආවේණික දෝෂ තත්ත්වයේ හෝ අඩුපාඩු;

(ආ) ප්‍රවාහකයා හෝ ප්‍රවාහකයාගේ සේවකයන් හෝ අනුයෝජිතයන් නොවන තැනැත්තකු විසින් ඉටුකරන ලද ඒ බඩුවල දෝෂ සහිත ඇසුරුම්;

(ඇ) යුධමය කටයුත්තක් හෝ සන්නද්ධ ගැටුමක්;

(ඈ) බඩු ප්‍රවේශ වීම, පිටතට යැවීම හෝ ප්‍රවාහනය සම්බන්ධයෙන් රාජ්‍ය ආයතනයක් විසින් සිදු කරනු ලබන ක්‍රියාවක්,

යන කරුණුවලින් එකක් හෝ ඊට වැඩි ගණනක් හේතුවෙන් බඩු විනාශ වීම හෝ නැතිවීම හෝ බඩුවලට හානි සිදුවී ඇත්නම් සහ ඒ මගින් ඔප්පු කර සිටින ප්‍රමාණයට ප්‍රවාහකයා වගකීමට බැඳී නොසිටියි.

3. මේ වගන්තියේ 1 වන ඡේදයේ අර්ථානුකූලව ගුවන් මගින් ප්‍රවාහනය යන්නට ප්‍රවාහකයා භාරයේ බඩු පවතින කාලසීමා අන්තර්ගත වේ.

4. ගුවන් මගින් ප්‍රවාහනය සිදු කරන කාලසීමාව ගුවන් තොටුපළකින් බැහැරව ගොඩබිමින්, මුහුදින් හෝ රටතුළ ජලමාර්ගයක් හරහා සිදු කරන යම් ප්‍රවාහනයක් සඳහා දීර්ඝ නොවේ. කෙසේ වුවත්, ගුවන් මගින් ප්‍රවාහනය සඳහා වන ගිවිසුම ඉටු කිරීමේ දී පැටවීම, බෙදාහැරීම හෝ වෙනත් ප්‍රවාහනයකට මාරුකිරීමේ කාර්යය සඳහා එකී ප්‍රවාහනයන් යොදා ගන්නේ නම් යම් හානියක් අනුමාන කිරීමේ දී එසේ නොවුන බව ඔප්පු කිරීමට යටත්ව, ගුවන් මගින් ප්‍රවාහනය සිදු කරන කාලසීමාව තුළ සිදු වූ සිදුවීමක් හේතුවෙන් සිදු වූ බව අනුමාන කෙරේ. පාර්ශ්වයන් අතර වූ ගිවිසුමක් මගින් ගුවන් මගින් ප්‍රවාහනය කිරීමට අරමුණු කළ පූර්ණ හෝ අර්ධ වශයෙන් වූ ප්‍රවාහනය කිරීමක් සඳහා ප්‍රවාහකයකු විසින් බඩු යවන්නාගේ එකඟතාව නොමැතිව වෙනත් ආකාරයේ ප්‍රවාහන ක්‍රමයක් ප්‍රවාහනය සඳහා ආදේශ කරගෙන ඇත්නම් එවැනි වෙනත් යම් ආකාරයේ වූ ප්‍රවාහනයක් මගින් සිදු වූ ප්‍රවාහනය ගුවන් මගින් ප්‍රවාහනය කළ කාලසීමාව තුළ ම ඇතුළත් වූ ප්‍රවාහනයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

### 19 වන වගන්තිය - ප්‍රමාදවීම්

මගීන්, ගමන් බඩු හෝ බඩු ප්‍රවාහනයේ දී ප්‍රමාදවීම් නිසා සිදුවන හානිවීම් සඳහා ප්‍රවාහකයා වගකිව යුතු වේ. එසේ වුව ද, ප්‍රවාහකයා සහ ප්‍රවාහකයාගේ සේවකයන් සහ අනුයෝජිතයන් විසින් ඒ හානිය වැළැක්වීම සඳහා සාධාරණව අවශ්‍ය කරනු ලැබිය හැකි සියලු පියවර ගත් බවට හෝ ප්‍රවාහකයාට හෝ ප්‍රවාහකයාගේ සේවකයන්ට හෝ අනුයෝජිතයන්ට එවැනි යම් පියවර ගැනීමට අපහසු වූ බවට ප්‍රවාහකයා විසින් ඔප්පු කරන්නේ නම් ප්‍රමාද වීම මගින් සිදු වූ පාඩුව සඳහා ප්‍රවාහකයා විසින් වගකිව යුතු නොවේ.

### 20 වන වගන්තිය - වගකීමෙන් නිදහස් කිරීම

වන්දි ඉල්ලා සිටින තැනැත්තාගේ හෝ ඔහුගෙන් හෝ ඇයගෙන් පැවත එන ඔහුගේ හෝ ඇයගේ අයිතිවාසිකම් දරන තැනැත්තකුගේ පැහැරහැරීමක් හෝ වෙනත් වැරදි සහගත ක්‍රියාවක් හෝ නොකර හැරීමක් හේතුවෙන් හෝ එවැනි දෙයක ආධාරයෙන් එම හානිය සිදුවූ බවට ප්‍රවාහකයා විසින් ඔප්පු කරන්නේ නම් එම හානියට හේතු වූ හෝ ආධාර වූ එම පැහැරහැරීම හෝ වැරදි සහගත ක්‍රියාව හෝ නොකර හැරීමේ ප්‍රමාණයට ප්‍රවාහකයා විසින් ඉල්ලුම්කරුට ඇති වගකීමෙන් පූර්ණ හෝ අර්ධ වශයෙන් ප්‍රවාහකයා නිදහස් කරනු ලැබිය යුතු ය. මගියකුගේ මියයාමක් හෝ තුවාල සිදුවීමක් යන හේතු වෙනුවෙන් එකී මගියා නොවන තැනැත්තකු විසින් වන්දි මුදලක් ඉල්ලා සිටින අවස්ථාවක දී, එම මගියාගේ පැහැරහැරීමක් හෝ වෙනත් වැරදි සහගත ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සිදුකිරීමෙන් හෝ ආධාර කර ගැනීමෙන් ඒ හානිය සිදුවූ බවට ප්‍රවාහකයා විසින් කරුණු ඔප්පු කරන ප්‍රමාණයට ප්‍රවාහකයා එහි වගකීමෙන් පූර්ණ හෝ අර්ධ වශයෙන් නිදහස් කරනු ලැබිය යුතු ය. 21 වන වගන්තියේ 1 වන ඡේදය ඇතුළුව මේ සම්මුතියේ සියලු වගකීමේ විධිවිධානවලට මෙම වගන්තිය අදාළ වේ.

### 21 වන වගන්තිය - මගියකුගේ මියයාම හෝ තුවාල සිදුවීමක් සම්බන්ධයෙන් වන්දි ලබාදීම

1. 17 වන වගන්තියේ 1 වන ඡේදය යටතේ ඇතිවන හානි සඳහා එක් එක් මගියා සඳහා වන විශේෂ ගැනුම් හිමිකම් 100,000 ට නොවැඩි ප්‍රමාණයක් සඳහා ප්‍රවාහකයාට තම වගකීම්වලින් බැහැර වීමට හෝ වගකීම් සීමාකිරීමට නොහැකි ය.

2. ප්‍රවාහකයා විසින් -

(අ) යම් හානියක් ප්‍රවාහකයාගේ හෝ ප්‍රවාහකයාගේ සේවකයන්ගේ හෝ අනුයෝජිතයන්ගේ නොසැලකිලිමත්බව හෝ වෙනත් වැරදි සහගත ක්‍රියාවක් හෝ නොකර හැරීමක් නිසා සිදු නොවූ බවට; හෝ

(ආ) එවැනි යම් හානියක් තුන්වැනි පාර්ශ්වයේ නොසැලකිලිමත් බව හෝ වෙනත් වැරදි සහගත ක්‍රියාවක් හෝ නොකර හැරීමක් හේතුවෙන් ම පමණක් සිදු වූ බවට,

ඔප්පු කරන්නේ නම්, 17 වන වගන්තියේ 1 වන ඡේදය යටතේ පැන නගින හානි සඳහා එක් එක් මගියා සඳහා වන විශේෂ ගැනුම් හිමිකම් 100,000 ට නොවැඩි ප්‍රමාණයකට ප්‍රවාහකයා වගකීමට බැඳී නොසිටිය යුතු ය.

**22 වන වගන්තිය - ගමන් බඩු සහ බඩු ප්‍රමාද වීම සම්බන්ධයෙන් වගකීම් සීමාකිරීම**

1. පුද්ගලයන් ප්‍රවාහනයේ දී 19 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාදවීම්වලින් සිදුවිය හැකි හානි සම්බන්ධයෙන් එක් එක් මගියා සඳහා වූ ප්‍රවාහකයාගේ වගකීම විශේෂ ගැනුම් හිමිකම් 4,150 ට සීමා වේ.

2. බඩු ප්‍රවාහනයේ දී, පරික්ෂා කරන ලද බඩු ප්‍රවාහකයා වෙත භාරදුන් අවස්ථාවේ දී ම මගියා විසින් ගමනාන්තය දක්වා ප්‍රවාහනය පිණිස කැමැත්ත පිළිබඳ විශේෂ ප්‍රකාශයක් ලබා දී ඇත්නම් ද, සහ එසේ අවශ්‍ය කරන කාරණයක් ඇත්නම් ද, අතිරේක මුදලක් ගෙවා ඇතිවිට මිස ගමන් බඩු විනාශ වීම, නැති වීම, හානි වීම හෝ ප්‍රමාද වීම සම්බන්ධයෙන් ප්‍රවාහකයාගේ වගකීම එක් එක් මගියා සඳහා විශේෂ ගැනුම් හිමිකම් 1,000 ට සීමා වේ. ගමනාන්තය දක්වා එකී බඩු යැවීම මගින් මගියා වෙත ඇතිවන ප්‍රතිලාභයට වඩා මෙම මුදල් ප්‍රමාණය විශාල බව ඔප්පු කරන්නේ නම් මිස, එවැනි කාරණාවක දී ප්‍රකාශිත මුදලට වඩා වැඩි නොවන මුදලක් ගෙවීම සඳහා ප්‍රවාහකයා වගකීමට බැඳී සිටියි.

3. බඩු ප්‍රවාහනයේ දී, බඩු ඇසුරුම ප්‍රවාහකයා වෙත භාර දුන් අවස්ථාවේ දීම , බඩු යවන්නා විසින් ගමනාන්තය දක්වා යැවීම පිණිස කැමැත්ත පිළිබඳ විශේෂ ප්‍රකාශයක් ලබා දී ඇත්නම් සහ එසේ අවශ්‍ය කරන කාරණයක් ඇත්නම් අතිරේක මුදලක් ගෙවා ඇති විට මිස, ගමන් බඩු විනාශ වීම, නැතිවීම, හානිවීම හෝ ප්‍රමාද වීම සම්බන්ධයෙන් ප්‍රවාහකයාගේ වගකීම කිලෝග්‍රෑම් එකක් සඳහා විශේෂ ගැනුම් හිමිකම් 17 ක මුදලකට සීමා වේ. ගමනාන්තය දක්වා එකී බඩු යැවීම මඟින් මගියා වෙත ඇතිවන ප්‍රතිලාභයට වඩා මෙම මුදල් ප්‍රමාණය විශාල බව ඔප්පු කරන්නේ නම් මිස එවැනි කාරණාවක දී ප්‍රකාශිත මුදලට වඩා වැඩි නොවන මුදලක් ගෙවීමට ප්‍රවාහකයා වගකීමට බැඳී සිටියි.

4. බඩුවල කොටසක් හෝ ඒ තුළ අඩංගු යම් වස්තුවක් විනාශ වීම, නැති වීම, හානිවීම හෝ ප්‍රමාද වීම සම්බන්ධයෙන් වූ කාරණාවක දී ප්‍රවාහකයන්ගේ වගකිව යුතු සීමාවේ ප්‍රමාණය කුමක් ද යන්න තීරණය කිරීමේ දී සැලකිල්ලට ගනු ලැබිය යුතු බර ප්‍රමාණය, අදාළ ඇසුරුමේ හෝ ඇසුරුම්වල මුළු බර ප්‍රමාණය ම පමණක් විය යුතු ය. එසේ වුව ද, බඩුවල කොටසක් හෝ ඒ තුළ ඇතුළත් යම් වස්තුවක් විනාශ වීම, නැතිවීම, හානිවීම හෝ ප්‍රමාද වීම සිදුවන විට දී එම බඩු 4 වන වගන්තියේ 2 වන ඡේදයේ සඳහන් කරන ලද වෙනත් යම් ආකාරයකින් සංරක්ෂණය කරන ලද එවැනිම වාර්තාවල හෝ ගුවන්වේ බිල්පත හෝ ලදු

පතෙහි සඳහන් කර නොමැති නම් එකම ගුවන්වේ බිල්පතකින් හෝ එකම ලදුපතකින් ආවරණය කරනු ලැබූ වෙනත් ඇසුරුම්වල වටිනාකමට හානි සිදුවූ විට වගකීම් සීමා කිරීම තීරණය කිරීමේ දී එවැනි ඇසුරුමක හෝ ඇසුරුම්වල මුළු බර ප්‍රමාණයන් සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

5. හානියක් සිදුකිරීමේ අරමුණින් සිදුකළ හෝ නොසැලකිලිමත්ව සහ සමහර විට ඒ හානිය සිදුවිය හැකි බව දැනුවත්වම ප්‍රවාහකයාගේ, ප්‍රවාහකයාගේ සේවකයන්ගේ හෝ අනුයෝජිතයන්ගේ ක්‍රියාවක් හෝ නොකර හැරීමක ප්‍රතිඵලයක් ලෙස හානිය සිදු වූ බවට ඔප්පු කරන්නනේ නම් ද; එසේ වුව ද, සේවකයකුගේ හෝ අනුයෝජිතයෙකුගේ එවැනි ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධ කාරණයක දී එකී සේවකයන් හෝ අනුයෝජිතයන් ඔවුන්ගේ වෘත්තීය විෂය පථය තුළ කටයුතු කරමින් සිටි බව ඔප්පු කරන විට ද, මේ වගන්තියේ 1 වන සහ 2 වන ඡේදවල කලින් සඳහන් කළ විධිවිධාන අදාළ නොවේ.

6. 21 වන වගන්තියේ සහ මේ වගන්තියේ නියම කරන ලද සීමාවන් මඟින්, පොළිය ද ඇතුළුව පැමිණිලිකරු විසින් නඩු පැවරීමේ දී සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් දරන ලද අධිකරණ ගාස්තු සහ නඩු පැවරීමේ දී දරන ලද අනෙකුත් වියදම්වලට අමතරව ස්වකීය නීතියකට අනුකූලව අධිකරණය මඟින් කරන ලද ප්‍රදානයන් ලබා දීම වැලැක්වීම නොකළ යුතුය. අධිකරණ ගාස්තු සහ නඩු පැවරීමේ දී දරන ලද අනෙක් වියදම් බැහැර කරමින් හානිය සිදු වූ දින සිට මාස 06 ක කාලසිමාවක් තුළ දී හෝ නඩුව ආරම්භ කිරීමට පෙරාතුව, යම් හෙයකින් පසුව පැමිණිලිකරුට ලියවිල්ලකින් ප්‍රවාහකයා විසින් ප්‍රදානය කර ඇති හානිය සඳහා වූ මුදල ඉක්මවා නොයන්නේ නම් කලින් සඳහන් කළ විධි විධාන අදාළ නොවේ.

## 23 වන වගන්තිය - මුදල් ඒකකවලට පරිවර්තනය කිරීම

1. මේ සම්මුතියේ විශේෂ ගනුම් හිමිකම් යනුවෙන් සඳහන් කරන ලද මුදල් ජාත්‍යන්තර මුල්‍ය අරමුදල මඟින් අර්ථ නිරූපණය කරන ලද විශේෂ ගැනුම් හිමිකම්වලට දක්වන සඳහනක් ලෙස සලකනු ලැබිය යුතුය. අධිකරණ කටයුත්තක් සම්බන්ධ කාරණයක දී ඒ නඩු තීන්දුව දුන් දිනයේ විශේෂ ගැනුම් හිමිකම් සඳහා වන මුදල්වල වටිනාකමට අනුකූලව දේශිය වලංගු මුදල් බවට පරිවර්තනය කරනු ලැබිය යුතුය. ජාත්‍යන්තර මුල්‍ය අරමුදලේ සාමාජිකයකු වන රාජ්‍ය පාර්ශ්වයක් විසින් විශේෂ ගැනුම් හිමිකම්වලට අනුකූලව දේශීය ව්‍යවහාර මුදල් වල වටිනාකම ගණනය කිරීමේ දී ජාත්‍යන්තර මුල්‍ය අරමුදල විසින් එහි මෙහෙයුම් සහ ගනුදෙනු සඳහා අදාළ කර ගන්නා ඇගයීමේ ක්‍රමවේදයන්ට අනුකූලව තීන්දුව ලබා දුන් දිනයේ සිට බලපැවැත්වෙන පරිදි සිදුකරනු ලැබිය යුතු ය. ජාත්‍යන්තර මුල්‍ය අරමුදලේ සාමාජිකයකු නොවන රාජ්‍ය පාර්ශ්වයක් විශේෂ ගැනුම් හිමිකම්වලට අනුකූලව දේශීය ව්‍යවහාර මුදල්වල වටිනාකම ගණනය කිරීමේ දී එකී රාජ්‍ය විසින් නිශ්චය කරනු ලබන ආකාරයකින් ගණනය කරනු ලැබිය යුතු ය.

2. එසේ වුව ත්, ජාත්‍යන්තර මුල්‍ය අරමුදලේ සාමාජිකයන් නොවන සහ මේ වගන්තියේ 1 වන ඡේදයේ විධිවිධාන අදාළ කර ගැනීමට නීතියෙන් අවසර නොදෙන යම් රාජ්‍යයක් විසින් අනුමත කරන හෝ ප්‍රවේශ වෙන අවස්ථාවේ හෝ ඉන් පසුව ඕනෑම අවස්ථාවක දී හෝ 21 වන වගන්තියේ නියම කරන ලද ගුවන් ප්‍රවාහකයකුගේ වගකීමේ සීමා එම රාජ්‍යවල දේශසීමාව තුළ අධිකරණ කටයුත්තක දී එක් ගුවන් මගියකු සඳහා මුල්‍ය ඒකක 1,500,000ක මුදලක් ලෙස ප්‍රකාශයට පත් කිරීම; එසේම 22 වගන්තියේ 1 වන ඡේදයට අනුව එක් ගුවන්

මගියකු සඳහා මූල්‍ය ඒකක 62,500ක මුදලක් ලෙස ප්‍රකාශයට පත් කිරීම; 22 වන වගන්තියේ 2 වන ඡේදයට අනුව එක් ගුවන් මගියකු සඳහා මූල්‍ය ඒකක 15,000 ක මුදලක් ලෙස ප්‍රකාශයට පත් කිරීම; සහ 22 වන වගන්තියේ 3 වන ඡේදයට අනුව කිලෝග්‍රෑම් එකක් සඳහා මූල්‍ය ඒකක 250ක් වශයෙන් වූ මුදලක් නියම කර ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය. මෙම මූල්‍ය ඒකකය දහසේ කොටස් නවසියයක පිරිසිදුකමෙන් යුත් රත්‍රං මිලිග්‍රෑම් හැටපහ හමාරකට අනුරූප වේ. මෙම මුදල් ආසන්න පූර්ණ සංඛ්‍යාවකින් යුක්ත වන ආකාරයට දේශීය ව්‍යවහාර මුදල්වලට පරිවර්තනය කරනු ලැබිය හැකි ය. මෙම මුදල් අදාළ ව්‍යවහාර මුදල්වලට පරිවර්තනය කිරීමේ දී අදාළ රාජ්‍ය විසින් සලකා බලනු ලබන නීතියට අනුකූලව සිදුකරනු ලැබිය යුතු ය.

3. මේ වගන්තියේ 1 වන ඡේදයේ අවසාන වගන්තියේ සඳහන් කරන ලද ගණනය කිරීම සඳහා සහ මේ වගන්තියේ 2 වන ඡේදයේ සඳහන් කරන ලද පරිවර්තනය කිරීමේ ක්‍රමවේදය සඳහා මේ වගන්තියේ 1 වන ඡේදයේ පළමු වගන්ති තුන අදාළ කරගැනීමේ ප්‍රතිඵලයක් ලෙස 21 වන සහ 22 වන වගන්තිවල වටිනාකම් සඳහා හැකිතාක් දුරට එහි නියම වටිනාකම දැක්වීමට පාර්ශ්වීය රාජ්‍යයක දේශිය ව්‍යවහාර මුදල්වලින් ප්‍රකාශ කළ හැකි යම් ආකාරයකට එය සිදුකරනු ලැබිය යුතු ය. අවස්ථාවෝචිත පරිදි මේ වගන්තියේ 1 වන ඡේදයට අනුකූලව ගණනය කළ ආකාරය හෝ මේ වගන්තියේ 2 වන ඡේදයේ සඳහන් පරිවර්තනයේ ප්‍රතිඵල පිළිබඳ සහ ඒ ආකාර දෙකේම වෙනස්වීමක් පවතින විට මේ සම්මුතිය අනුමත කිරීමේ දී, පිළිගැනීමේ දී, අනුමැතිය දීමේ දී, හෝ සම්මුතියට ප්‍රවේශ වීමේ සාධන පත්‍රයක් තැන්පත් කිරීමේ දී පාර්ශ්වීය රාජ්‍යයක් විසින් තැන්පතුධාරියාට දැනුම් දෙනු ලැබිය යුතු ය.

## 24 වන වගන්තිය - සීමාවන් සමාලෝචනය කිරීම.

1. මේ සම්මුතියේ 25 වන වගන්තියේ විධිවිධානවලට අගතියක් නොමැතිව සහ පහත දැක්වෙන 2 වන ඡේදයට යටත්ව 21 වන සහ 22 වන සහ 23 වන වගන්තිවලින් නියම කරන ලද වගකීම් සීමාකිරීම වසර 5 ක විරාම කාලයක් තුළ දී තැන්පතුධාරියා විසින් සමාලෝචනය කරනු ලැබිය යුතු ය. මේ සම්මුතිය බලාත්මක වීමට එළඹෙන දිනයට පසුව වසර 5 අවසානයේ හෝ සම්මුතිය අත්සන් කිරීම සඳහා ප්‍රථමවරට විවෘත කරන දින සිට වසර පහක කාලයක් තුළ සම්මුතිය බලාත්මක වීමට එළඹ නොමැතිනම් කලින් සංශෝධනයේ සිට හෝ සම්මුතිය බලාත්මක වීමට එළඹෙන දින සිට පළමුවරට උද්ධමනය වැඩිවීමේ ප්‍රමාණයට අනුරූපි වන උද්ධමන සාධකයට කරන සඳහනක් මඟින් බලාත්මක වීමට එළඹ එහි පළමු වසර තුළ එවැනි ප්‍රතිශෝධනයක් සිදු කළ යුතු ය. උද්ධමන සාධකය තීරණය කිරීමේ දී භාවිතා කළ යුතු උද්ධමන අනුපාත මිම්ම 23 වන වගන්තියේ 1 වන ඡේදයේ සඳහන් කරන ලද විශේෂ ගැනුම් හිමිකම් අඩංගු ව්‍යවහාර මුදල් ඇත්තේ යම් රාජ්‍යක ද එවැනි රාජ්‍යයක පාරිභෝගික මිල දර්ශකයේ වැඩිවීමේ හෝ අඩුවීමේ වාර්ෂික අනුපාතයේ  අගයේ සාමාන්‍ය විය යුතු ය.

2. ඉහතින් වූ ඡේදයේ සඳහන් කරන ලද ප්‍රතිශෝධනයක දී උද්ධමන සාධකය සියයට දහයකින් වැඩි වී ඇති බවට තීරණය කරන්නේ නම්, වගකීම් සීමා කිරීමේ ප්‍රතිශෝධනය පිළිබඳ තැන්පතුධාරියා විසින් පාර්ශ්වීය රාජ්‍යයන්ට දැනුම් දෙනු ලැබිය යුතු ය. එවැනි යම් ප්‍රතිශෝධනයක් පාර්ශ්වීය රාජ්‍යයන්ට දැනුම් දීමෙන් පසුව මාස හයක් තුළ දී බලාත්මක විය යුතු ය. පාර්ශ්වීය රාජ්‍යයන් වෙත එය එම දැනුම්දීමෙන් පසු ව මාස තුනක් ඇතුළත දී පාර්ශ්වීය රාජ්‍යවල බහුතරයක් විසින් ඔවුන්ගේ අනනුමතිය ලියාපදිංචි කර ඇත්නම් ප්‍රතිශෝධනය බලාත්මක භාවයට නොඑළඹිය යුතු අතර තැන්පතුධාරියා විසින් පාර්ශ්වීය

රාජ්‍යයන්ගේ රැස්වීමකට එකී කාරණය යොමු කළ යුතු ය. තැන්පතුධාරියා විසින් යම් ප්‍රතිශෝධනයක් බලාත්මකභාවයට එළඹීමේ දී සියලු පාර්ශ්වීය රාජ්‍යයන්ට එය නොපමාව දැනුම් දිය යුතු ය.

3. මේ වගන්තියේ 1 වන ඡේදයේ කුමක් සඳහන් වුව ද, කලින් ප්‍රතිශෝධනයේ සිට හෝ කලින් ප්‍රතිශෝධනයක් තිබී නොමැතිනම් මේ සම්මුතිය බලාත්මක වීමට එළඹුන දින සිට 1 වන ඡේදයේ සඳහන් කරන ලද උද්ධමන සාධකය සියයට තිහක් ඉක්මවා ඇති බවට වූ කොන්දේසි මත අභිලාෂය ප්‍රකාශ කිරීමට පාර්ශ්වීය රාජ්‍යයන්ගෙන් තුනෙන් එකකට විධිවිධාන සලසා ඇති ඕනෑම අවස්ථාවක, මේ වගන්තියේ 2 වන ඡේදයේ සඳහන් කරන ලද ක්‍රියාපටිපාටිය අදාළ කරගනු ලැබිය යුතු ය. මේ වගන්තියේ මේ ඡේදය යටතේ සිදු කරන ලද ප්‍රතිශෝධනයේ දින සිට වසර පහක කාලය අවසානයේ දි ආරම්භ වන වසර පහක විරාම කාලයේ දී 1 වන ඡේදයේ විස්තර කරන ලද ක්‍රියාපටිපාටිය භාවිතා කරමින් පසුව සිදුකරන ප්‍රතිශෝධන සිදුවිය යුතු ය.

### 25 වන වගන්තිය - සීමා පිළිබඳ නියමය

ප්‍රවාහකයකු විසින්, ප්‍රවාහන ගිවිසුම මේ සම්මුතියේ විධිවිධාන සලසා ඇති සීමාවන්ට වඩා ඉහළ වගකීමේ සීමාවන්ට හෝ කවර හෝ කිසිදු සීමාවක් නැති වගකීමකට යටත් විය යුතු යයි නියම කරනු ලැබිය හැකි ය.

### 26 වන වගන්තිය - ගිවිසුම් විධිවිධානවල නිර්බල භාවය

ප්‍රවාහකයාගේ වගකීම් පිළිබඳ සහනයක් ලබා දීමට හෝ මේ සම්මුතියේ දක්වා ඇති වගකීමේ සීමාවන්ට වඩා අඩුම සීමාවකින් වගකීමේ සීමා නියම කිරීමට පාදක වන යම් විධිවිධානයක් ශූන්‍ය සහ බලරහිත විය යුතු නමුත් එවැනි යම් විධිවිධානයක ශූන්‍යතාවය, සම්පූර්ණ ගිවිසුමේ ශූන්‍යතාවය ලෙස අදහස් නොකරන අතර, මේ සම්මුතියේ විධිවිධානවලට යටත්ව එම විධිවිධාන ඉතිරි විය යුතු ය.

### 27 වන වගන්තිය - ගිවිසගැනීමට ඇති නිදහස

සම්මුතිය යටතේ පවතින යම් ආරක්ෂාවක් අත් හැර දැමීමෙන් හෝ මේ සම්මුතියේ විධිවිධාන හා ගැටීමක් ඇති නොවන කොන්දේසි සකස් කිරීම මගින් ප්‍රවාහකයා යම් ප්‍රවාහන ගිවිසුමකට ඇතුළත් වීම ප්‍රතික්ෂේප කිරීම මේ සම්මුතියේ ඇතුළත් කිසිවකින් ප්‍රවාහකයා වැලැක්වීම නොකළ යුතු ය.

### 28 වන වගන්තිය - අත්තිකාරම් ගෙවීම

මගීන්ගේ මරණය හෝ තුවාල සිදුවීමකට හේතු වන ගුවන් යානා අනතුරක් සම්බන්ධ අවස්ථාවක දී, එහි දේශීය නීතිය මඟින් නියම කර ඇත්නම්, මරණය හෝ තුවාල සිදුවූ ඒ තැනැත්තන්ගේ හදිසි ආර්ථික අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස වන්දි මුදල් ඉල්ලා සිටීමට හිමිකම් පාන ස්වාභාවික තැනැත්තකුට හෝ තැනැත්තන්ට ප්‍රවාහකයා විසින් නොපමාව අත්තිකාරම් ගෙවීම සිදු කළ යුතු ය. ඒ අත්තිකාරම් ගෙවීම වගකීම පිළිගැනීමක් සේ වූ මුදලක් ලෙස අදාළ නොකල යුතු අතර, ප්‍රවාහකයා විසින් හානි ලෙස පසුව ගෙවන යම් මුදලක් වෙනුවට හිලව් කරනු ලැබිය යුතු ය.

### 29 වන වගන්තිය - හිමිකම්වල පදනම

එම හානිය මගීන්, ගමන් බඩු සහ බඩු ප්‍රවාහනය සම්බන්ධ හානි සඳහා වන යම් නඩු කටයුත්තක දී, මේ සම්මුතිය හෝ ගිවිසුම හෝ තෝර්තය යටතේ හෝ අන්‍යාකාරයකින් ද යන්න සොයා ගැනීම කෙසේ වුවත්, හානි සඳහා වන යම් නඩු කටයුත්තක දී නඩුවක් ඉදිරිපත් කිරීමට අයිතිය ඇති තැනැත්තන් කවුරුන්ද සහ ඔවුන්ගේ අදාළ අයිතිවාසිකම් මොනවා ද යන ප්‍රශ්නවලට අගතියක් නොමැතිව මේ සම්මුතියේ දක්වා ඇති කොන්දේසි සහ යම් වගකීමේ සීමා වලට යටත්ව පමණක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එවැනි යම් නඩු කටයුත්තක දී, දණ්ඩනයක දී, අනුකරණයක දී, හෝ වෙනත් යම් වන්දි ගෙවීමක් නොකරන හානිවලදී අය කර ගනු නොලැබිය යුතු ය.

### 30 වන වගන්තිය - සේවකයන්ගේ, අනුයෝජිතයන්ගේ හිමිකම් සම්භාරය

1. සම්මුතියට අදාළ වන හානියක් ඇතිවීමේ දී ප්‍රවාහකයාගේ සේවකයකුට හෝ අනුයෝජිතයකුට එරෙහිව නඩු කටයුත්තක් ඉදිරිපත් කර ඇත්නම්, ඒ සේවකයා හෝ අනුයෝජිතයා විසින් ඔවුන්ගේ වෘත්තීය විෂය පථය තුළ ඔවුන් ක්‍රියා කර ඇති බවට ඔප්පු කලහොත් මේ සම්මුතිය යටතේ ප්‍රවාහකයා විසින් අයැද සිටීමට හිමිකම් ලබන කොන්දේසි සහ වගකීමේ සීමා තමන් සඳහා ඉල්ලා සිටීමට ඒ සේවකයාට හෝ අනුයෝජිතයාට හිමිකම් තිබිය යුතු ය.

2. එවැනි කාරණයක දී ප්‍රවාහකයකුගෙන්, ප්‍රවාහකයාගේ සේවකයකුගෙන් සහ අනුයෝජිතයන්ගෙන් අයකරගත හැකි මුදලේ එකතුව එකී සීමාවන් නොඉක්මවිය යුතු ය.

3. බඩු ප්‍රවාහනය සම්බන්ධයෙන් හැර, හානි සිදුකිරීමේ චේතනාවෙන් හෝ නොසැලකිලිමත්ව සහ අලාභය සිදුවිය හැකි බවට දැනගෙන සේවකයා හෝ අනුයෝජිතයා විසින් කරන ලද යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක ප්‍රතිඵලයක් ලෙස ඒ හානිය සිදුවී ඇති බව ඔප්පු කරන්නේ නම් මේ වගන්තියේ 1 වන සහ 2 වන ඡේදවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

### 31 වන වගන්තිය - පැමිණිලි කාලෝචිතව දැනුම් දීම

1. පරික්ෂා කළ ගමන් බඩු හෝ බඩු ලැබීමට හිමිකම් ලබන තැනැත්තා විසින් පැමිණිල්ලකින් තොරව භාර ගැනීම ඒ භාණ්ඩ යහපත් තත්ත්වයෙන් සහ ප්‍රවාහන ලේඛනවලට අනුකූලව හෝ 3 වන වගන්තියේ 2 වන ඡේදයේ සහ 4 වන වගන්තියේ 2 වන ඡේදයේ සඳහන් කරන ලද වෙනත් යම් ආකාරයකින් සංරක්ෂණය කළ වාර්තාවලට අනුකූලව භාර දී තිබෙන බවට බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් වන්නේ ය.

2. හානියක් සිදුවී ඇති විට, භාර දීමට හිමිකම් ලබන තැනැත්තා විසින් හානිය සොයා ගත් වහාම සහ පරික්ෂා කළ ගමන් බඩු සම්බන්ධ කරුණක දී අවම වශයෙන් ලැබුණු දින සිට දින හතක් ඇතුළත සහ බඩු සම්බන්ධ කරුණක දී ලැබුණු දින සිට දින දාහතරක් ඇතුළත නොපමාව ප්‍රවාහකයා වෙත පැමිණිල්ලක් කළ යුතු ය. ප්‍රමාද වීමක් සම්බන්ධ කරුණක දී, ඒ ගමන් බඩු හෝ බඩු ඔහු හෝ ඇය වෙත භාර දුන් දිනයේ සිට දින විසි එකක් ඇතුළත පැමිණිල්ල සිදු කරනු ලැබිය යුතු ය.

3. සෑම පැමිණිල්ලක් ම ලිඛිතව සිදු කරනු ලැබිය යුතු අතර, ඉහත සඳහන් කාලය තුළ දී ලබා දීම හෝ යැවීම කළ යුතු ය.

4. ඉහත සඳහන් කාලය තුළ දී පැමිණිල්ලක් සිදු කර නොමැති නම්, වංචාවක් සම්බන්ධ කාරණයක දී හැර ප්‍රවාහකයාට එරෙහිව කිසිදු නඩුවක් නොපැවරිය යුතු ය.

32 වන වගන්තිය - වගකිව යුතු තැනැත්තන්ගේ මරණය

වගකිව යුතු තැනැත්තකු මිය ගිය අවස්ථාවක දී, ඔහුගේ හෝ ඇයගේ බූදලය නීත්‍යනුකූලව නියෝජනය කරන තැනැත්තන්ට එරෙහිව මේ සම්මුතියේ නියමයන්ට අනුකූලව හානි සඳහා වන නඩු කටයුත්තක් බල පැවැත්වේ.

33 වන වගන්තිය - අධිකරණ බලය

1. හානි සඳහා වන නඩු කටයුත්තක්, පැමිණිලිකරුගේ තෝරා ගැනීම පරිදි, පාර්ශ්වීය රාජ්‍යයන්ගෙන් එක් රාජ්‍ය දේශ සීමාවක් තුළ, ප්‍රවාහකයාගේ නිත්‍ය පදිංචිය ඇත්තා වූ හෝ ඔහුගේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇති ප්‍රදේශයේ අධිකරණය ඉදිරිපිට දී හෝ ව්‍යාපාරික ස්ථානයක් හරහා ගිවිසුම සිදුකර ඇති අවස්ථාවක දී, ඒ ආයතනය පිහිටි ස්ථානය හෝ ගමනාන්තය සිදුවන ස්ථානයේ අධිකරණය ඉදිරිපිට දී හෝ පැවරිය යුතු ය.

2. මගියෙකුගේ මරණය හෝ තුවාල සිදුවීමේ ප්‍රතිඵලයක් ලෙසින් සිදුවන හානියක් සම්බන්ධයෙන් මේ වගන්තියේ 1 වන ඡේදයේ සඳහන් කරන ලද අධිකරණවලින් එකක් ඉදිරිපිට දී හෝ මගියාගේ අනතුර සිදුවන වේලාවේ ඔහුගේ හෝ ඇයගේ ප්‍රධාන සහ ස්ථිර වාසස්ථානය තිබෙන සහ ප්‍රවාහකයාගේ ස්වකීය ගුවන් යානයකින් හෝ වාණිජමය ගිවිසුමකට අනුව වෙනත් ප්‍රවාහකයකුගේ ගුවන් යානයක යන දෙයාකාරයෙන් එක් ආකාරයකට ගුවන් ප්‍රවාහනය සඳහා ප්‍රවාහකයා සේවා පවත්වා ගෙන යන ස්ථානයක් තිබෙන ප්‍රවාහකයකු විසින් සහ එම පළමු ප්‍රවාහකයා සමග වාණිජ ගිවිසුමක් තිබෙන වෙනත් ප්‍රවාහකයකු විසින් බද්දට ගත් හෝ ප්‍රවාහකයාට අයිති පරිශ්‍රයකින් ගුවන් ප්‍රවාහනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන පාර්ශ්වීය රාජ්‍යයක දේශ සීමා තුළ දී නඩු කටයුත්තක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

3. 2 වන ඡේදයේ කාර්යයන් සඳහා-

(අ) "වාණිජ ගිවිසුමක්" යන්නෙන් ප්‍රවාහකයන් අතර සහ මගීන් ගුවනින් ප්‍රවාහනය සඳහා ඔවුන්ගේ ඒකාබද්ධ සේවාවේ විධිවිධානවලට අදාළව සාදන ලද නියෝජ්‍යත්ව ගිවිසුමක් නොවන ගිවිසුමක් අදහස් වේ;

(ආ) "ප්‍රධාන සහ ස්ථිර වාසස්ථාන" යන්නෙන් අනතුර සිදුවන අවස්ථාවේ දී මගියාගේ ස්ථාවර සහ ස්ථිර වාසස්ථානයක් අදහස් වේ. මගියාගේ ජාතිය, මේ සම්බන්ධයෙන් තීරණය කිරීමේ සාධකයක් නොවිය යුතු ය.

4. ක්‍රියා පටිපාටිය පිළිබඳ ප්‍රශ්න, නඩුව අයත් වන අධිකරණයේ නීතිය විසින් පාලනය කරනු ලැබිය යුතු ය.

34 වන වගන්තිය - බේරුම් කිරීම

1. මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව, බඩු ප්‍රවාහනය සඳහා වන ගිවිසුමේ පාර්ශ්වකරුවන් විසින් මේ සම්මුතිය යටතේ ප්‍රවාහකයාගේ වගකීම්වලට අදාළ වන යම් ආරවුලක් බේරුම් කිරීම මගින් විසඳිය යුතු බවට නියම කරනු ලැබිය හැකිය. ඒ ගිවිසුම ලිඛිත විය යුතු ය.

2. හිමිකම්පාන්නාගේ කැමැත්ත පරිදි, බේරුම් කිරීමේ ක්‍රියාවලිය 33 වන වගන්තියේ සඳහන් කරන ලද අධිකරණ බලය හිමි එක් ස්ථානයක දී සිදු කළ යුතු ය.

3. බේරුම්කරු හෝ බේරුම්කාර විනිශ්චය සභාව විසින් මේ සම්මුතියේ විධිවිධාන අදාළ කරගනු ලැබිය යුතු ය.

4. මේ වගන්තියේ 2 වන සහ 3 වන ඡේදවල විධිවිධාන සෑම බේරුම් කිරීමේ වගන්තියක හෝ ගිවිසුමක කොටසක් විය යුතු බවට සලකනු ලැබිය යුතු අතර, ඒ ඡේදවල විධිවිධාන සමග අනුකූල නොවන එම වගන්තියේ හෝ ගිවිසුමේ යම් නියමයක් ශූන්‍ය සහ බලරහිත ලෙස සලකනු ලැබිය යුතු ය.

35 වන වගන්තිය - නඩු කටයුතු සීමා කිරීම

1. ගමනාන්තයට පැමිණි දින සිට හෝ ගුවන් යානය පැමිණිය යුතු ව තිබූ දින සිට හෝ ප්‍රවාහනය නතර කල දින සිට හෝ ගණනය කරන ලද වසර දෙකක කාල සීමාවක් තුළ දී නඩු කටයුත්තක් ඉදිරිපත් කර නැත්නම් හානි සඳහා වන අයිතිය අවසන් විය යුතු ය.

2. නඩුව අයත් වන අධිකරණයේ නීතිය මගින් කාලසීමාව ගණනය කිරීමේ ක්‍රමය තීරණය කරනු ලැබිය යුතු ය.

36 වන වගන්තිය - අනුක්‍රමික ප්‍රවාහනය

1. විවිධ අනුක්‍රමික ප්‍රවාහකයන් විසින් ඉටු කරනු ලබන ප්‍රවාහනයක් සම්බන්ධ කාරණයක දී සහ 1 වන වගන්තියේ 3 වන ඡේදයේ දක්වා ඇති අර්ථ නිරූපණය තුළට ඇතුළත් වන විට අදාළ මගීන්, ගමන් බඩු හෝ බඩු භාර ගන්නා එක් එක් ප්‍රවාහකයා මේ සම්මුතියේ දක්වා ඇති රීතිවලට යටත් වන අතර, ප්‍රවාහකයාගේ අධීක්ෂණය යටතේ ඉටු කරනු ලබන ප්‍රවාහනයේ යම් කොටසක් සම්බන්ධයෙන් වන තාක් දුරට ඔහු ප්‍රවාහන ගිවිසුමට ඇතුළත් වන පාර්ශ්වයන්ගෙන් එක් අයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

2. මෙවැනි ආකාරයේ ප්‍රවාහනය සම්බන්ධ වන විට දී, ප්‍රකාශිත ගිවිසුමක් මගින් පළමු ප්‍රවාහකයා විසින් සම්පූර්ණ ගමන සඳහා වගකීම් භාරගෙන ඇති අවස්ථාවක දී හැර ඔහු හෝ ඇය සම්බන්ධයෙන් වන්දි මුදලකට හිමිකම් පාන මගියකු හෝ යම් තැනැත්තකු විසින් නඩු පැවරිය හැක්කේ අනතුර හෝ ප්‍රමාදය සිදු වූ අවස්ථාවේ ප්‍රවාහනය සිදු කල ප්‍රවාහකයාට එරෙහි ව පමණි.

3. ගමන් බඩු හෝ බඩු සම්බන්ධයෙන් පළමු ප්‍රවාහකයාට එරෙහිව නඩුවක් ගොනු කිරීමේ අයිතිවාසිකමක් මගියකුට හෝ බඩු යවන්නාට තිබිය යුතු අතර, මගියා හෝ බඩු භාර ගැනීම සඳහා අයිතිය ඇති බඩු ලබන්නාට අවසාන ප්‍රවාහකයා සම්බන්ධයෙන් නඩු පැවරීමට අයිතිය ඇත. තව ද එකී විනාශ වීම, නැති වීම,

හානිවීම හෝ ප්‍රමාදය සිදු වූ කාලය තුළ දී ප්‍රවාහනය සිදු කළ ප්‍රවාහකයාට එරෙහිව එක් එක් ක්‍රියාමාර්ගයක් ගනු ලැබිය හැකි ය. මෙම ප්‍රවාහකයන් මගියාට හෝ බඩු යවන්නාට හෝ බඩු ලබන්නාට එක්ව සහ වෙන් වෙන්ව වගකීමට බැඳී සිටිය යුතු ය.

**37 වන වගන්තිය - තුන්වන පාර්ශ්වයට එරෙහිව ආධාර ලබා ගැනීමේ අයිතිවාසිකම**

සම්මුතියේ විධිවිධානවලට අනුකූලව හානි සඳහා වගකිව යුතු තැනැත්තකුට, වෙනත් යම් තැනැත්තකුට එරෙහිව ආධාර ලබා ගැනීමේ අයිතිවාසිකමක් තිබෙන්නේ ද යන ප්‍රශ්නයට මේ සම්මුතියේ කිසිවකින් අගතියක් නොවිය යුතු ය.

IV වන පරිච්ඡේදය

**ඒකාබද්ධ ප්‍රවාහනය**

**38 වන වගන්තිය - ඒකාබද්ධ ප්‍රවාහනය**

1. ප්‍රවාහනයේ කොටසක් ගුවන් මගින් සහ කොටසක් වෙනත් යම් ආකාරයක ඉටු කරන ඒකාබද්ධ ප්‍රවාහනයක දී, ගුවන් ප්‍රවාහනය සඳහා 1 වන වගන්තියේ නියමයන්ට අදාළ වුව ද, 18 වන වගන්තියේ 4 වන ඡේදයට යටත්ව, මේ සම්මුතියේ විධිවිධාන ගුවන් ප්‍රවාහනය සඳහා පමණක් අදාළ කරගනු ලැබිය යුතු ය.

2. පාර්ශ්වකරුවන් විසින් ඒකාබද්ධ ප්‍රවාහනයක දී ගුවන් ප්‍රවාහන ලේඛනය සඳහා අනෙකුත් ප්‍රවාහන ක්‍රමවලට අදාළ කොන්දේසි ඇතුළත් කිරීම මේ සම්මුතියේ ඇතුළත් කිසිවක් මගින් නොවැළැක්විය යුතු ය. එසේ වුව ද, ගුවන් ප්‍රවාහනය සම්බන්ධයෙන් මේ සම්මුතියේ විධිවිධාන අනුව ක්‍රියාකරනු ලැබිය යුතු ය.

V වන පරිච්ඡේදය

**ගිවිසුම්ගත ප්‍රවාහකයකු නොවන තැනැත්තකු විසින් ඉටුකරන ගුවන් ප්‍රවාහනය**

**39 වන වගන්තිය - ගිවිසුම්ගත ප්‍රවාහකයා - විද්‍යාමාන ප්‍රවාහකයා**

ප්‍රධානියකු ලෙස (මෙහි මින්මතු "ගිවිසුම්ගත ප්‍රවාහකයකු යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තැනැත්තකු විසින් මගියා හෝ බඩු යවන්නා සමග හෝ මගියා හෝ බඩු යවන්නා වෙනුවෙන් ක්‍රියා කරන තැනැත්තකු සමග සහ වෙනත් තැනැත්තකු විසින් (මෙහි මින්මතු "විද්‍යාමාන ප්‍රවාහකයා" යනුවෙන් සඳහන් කරනු ලබන) මේ සම්මුතියේ අර්ථානුකූලව අනුප්‍රාප්ත ප්‍රවාහකයකුගේ යම් කොටසක් සම්බන්ධයෙන් නොවන නමුත්, ගිවිසුම්ගත ප්‍රවාහකයාගේ අධිකාරය මත සම්පූර්ණ ප්‍රවාහනය හෝ එම ප්‍රවාහනයේ කොටසක් ඉටු කිරීම සඳහා මෙම සම්මුතියෙන් පාලනය වන ගිවිසුමක් ඇති කරනු ලබන අවස්ථාවක දී මේ පරිච්ඡේදයේ විධිවිධාන අදාළ වේ. පටහැනි බවට සාධක නොමැති වීමේ දී ඒ බලය පූර්වානුමාන කළ යුතු ය.

40 වන වගන්තිය - ගිවිසුම්ගත සහ විද්‍යාමාන ප්‍රවාහකයන්ගේ අදාළ වගකීම්

39 වන වගන්තියේ සඳහන් කරන ලද ගිවිසුමට අනුකූලව මේ සම්මුතිය මඟින් පාලනය වන සම්පූර්ණයෙන්ම ප්‍රවාහනය හෝ එම ප්‍රවාහනයෙන් කොටසක් විද්‍යාමාන ප්‍රවාහකයා විසින් ඉටු කරයි නම්, ගිවිසුම්ගත ප්‍රවාහකයා සහ විද්‍යාමාන ප්‍රවාහකයා යන දෙදෙනාම මේ පරිච්ඡේදයේ අන්‍යාකාරයකින් විධිවිධාන සලසා ඇත්නම් හැර, ප්‍රථමයෙන් ගිවිසුමේ සඳහන් සම්පූර්ණ ප්‍රවාහනය සඳහා ද, පසුව වෙන් වෙන් වශයෙන් ඉටු කරන ලද ප්‍රවාහනය සඳහා ද මේ සම්මුතියේ රීතිවලට යටත් විය යුතු ය.

41 වන වගන්තිය - අන්‍යෝන්‍ය වගකීම්

1. විද්‍යාමාන ප්‍රවාහකයා විසින් ඉටු කරනු ලබන ප්‍රවාහනයට අදාළව විද්‍යාමාන ප්‍රවාහකයා සහ එම ප්‍රවාහකයාගේ සේවකයන් සහ අනුයෝජිතයන් විසින් ඔවුන්ගේ රැකියා ක්ෂේත්‍රය තුළ සිදු කරන යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් ගිවිසුම්ගත ප්‍රවාහකයා විසින් සිදු කළ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

2. විද්‍යාමාන ප්‍රවාහකයා විසින් ඉටු කරනු ලබන ප්‍රවාහනයට අදාළව, ගිවිසුම්ගත ප්‍රවාහකයා විසින් සහ එම ප්‍රවාහකයාගේ සේවකයන් සහ අනුයෝජිතයන් විසින් ඔවුන්ගේ රැකියා ක්ෂේත්‍රය තුළ සිදු කරන යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක්, විද්‍යාමාන ප්‍රවාහකයා විසින් සිදුකළ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය. එසේ නමුත්, 21 වන, 22 වන, 23 වන සහ 24 වන වගන්තිවල සඳහන් කරන ලද මුදල් ප්‍රමාණය ඉක්මවන වගකීමට විද්‍යාමාන ප්‍රවාහකයාගේ එවැනි යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමකට යටත් නොවිය යුතු ය. ගිවිසුම්ගත ප්‍රවාහකයා විසින් මේ සම්මුතිය මඟින් පනවා නොමැති යම් විශේෂ ගිවිසුමක් යටතේ පිළිගත් බැඳීම් සඳහා හෝ මේ සම්මුතිය මඟින් පනවන ලද අයිතීන් හෝ ආරක්ෂා වන අත් හැරීමක් සඳහා හෝ 22 වන වගන්තියේ අදහස් කරන ලද ගමනාන්තයේ දී භාර දීමේ කැමැත්ත පිළිබඳ විශේෂ ප්‍රකාශයක් සඳහා හෝ විද්‍යාමාන ප්‍රවාහකයා එකඟ වී ඇත්නම් මිස එය විද්‍යාමාන ප්‍රවාහකයා සඳහා බල නොපෑ යුතු ය.

42 වන වගන්තිය - පැමිණිලි සහ උපදෙස් ලැබිය යුතු අය

මේ සම්මුතිය යටතේ ප්‍රවාහකයාට ඉදිරිපත් කළ යුතු යම් පැමිණිල්ලක් හෝ දිය යුතු උපදෙසක් ගිවිසුම්ගත ප්‍රවාහකයාට හෝ විද්‍යාමාන ප්‍රවාහකයාට යොමු කල ද එහි බලපෑම නොවෙනස්ව එලෙසම තිබිය යුතු ය. එසේ වුවත්, 12 වන වගන්තියේ සඳහන් කරන ලද උපදෙස් ගිවිසුම්ගත ප්‍රවාහකයාට යොමු කර ඇත්නම් පමණක් බලාත්මක විය යුතු ය.

43 වන වගන්තිය - සේවකයන් සහ අනුයෝජිතයන්

විද්‍යාමාන ප්‍රවාහකයා, විද්‍යාමාන ප්‍රවාහකයාගේ හෝ ගිවිසුම්ගත ප්‍රවාහකයාගේ යම් සේවකයකු හෝ අනුයෝජිතයකු හෝ ගිවිසුම්ගත ප්‍රවාහකයකු විසින් සිදු කරනු ලබන ප්‍රවාහනයට අදාළව, ඔවුන් විසින් ඔවුන්ගේ රැකියා ක්ෂේත්‍රය තුළ ක්‍රියා කර ඇති බවට ඔවුන් ඔප්පු කරන්නේ නම් ද මේ සම්මුතියට අනුව අයැද සිටින වගකීමේ සීමා වළක්වන ආකාරයට ඔවුන් ක්‍රියා කර ඇත්නම් ද එකී ප්‍රවාහකයකුට, එම ප්‍රවාහකයාගේ සේවකයකුට හෝ අනුයෝජිතයකුට මේ සම්මුතිය යටතේ අදාළ වන කොන්දේසි සහ වගකීම් සීමා ඔවුන් විසින් ද ආධාර කර ගැනීමට හිමිකම් ලැබිය යුතු ය.

### 44 වන වගන්තිය - හානිවල එකතුව

විද්‍යාමාන ප්‍රවාහකයා විසින් ඉටු කරනු ලබන ප්‍රවාහනයක දී ප්‍රවාහකයාගෙන් සහ ගිවිසුම්ගත ප්‍රවාහකයකුගෙන් සහ ඔවුන්ගේ සේවකයන් සහ අනුයෝජිතයන්, ඔවුන්ගේ රැකියා ක්ෂේත්‍රයට අයත් විෂය පථය තුළ ක්‍රියා කිරීමේ දී අයකර ගත හැකි මුළු මුදල, මේ සම්මුතිය යටතේ ගිවිසුම්ගත ප්‍රවාහකයා හෝ විද්‍යාමාන ප්‍රවාහකයා යන දෙදෙනොගෙන් එක් අයෙකුට එරෙහිව නියම කරනු ලැබිය හැකි ඉහළම මුදලට වඩා වැඩි නොවිය යුතු ය. නමුත් සඳහන් කරන ලද තැනැත්තන්ගෙන් කිසිවකු ඒ තැනැත්තාට අදාළ වන සීමාව ඉක්මවා යන මුදලකට වගකීමට ලක් නොකළ යුතු ය.

### 45 වන වගන්තිය - හිමිකම් ලැබිය යුතු තැනැත්තන්

විද්‍යාමාන ප්‍රවාහකයා විසින් සිදු කරනු ලබන ප්‍රවාහනයකට අදාළව, හානි සඳහා වන නඩු කටයුත්තක් පැමිණිලිකරුගේ කැමැත්ත පරිදි එකී විද්‍යාමාන ප්‍රවාහකයාට හෝ ගිවිසුම්ගත ප්‍රවාහකයාට හෝ දෙදෙනාටම එරෙහිව එක්ව හෝ වෙන්වෙන්ව ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. එවැනි ප්‍රවාහකයන්ගෙන් එක් අයකුට පමණක් එරෙහිව නඩු කටයුත්තක් ඉදිරිපත් කර ඇතිනම්, ඒ නඩුව අයත් වන අධිකරණයේ නීතිය විසින් පාලනය කරනු ලබන නඩු කටයුත්ත සඳහා, ක්‍රියාපටිපාටිය සඳහා, හෝ බලපෑම සඳහා අනෙක් අදාළ ප්‍රවාහකයා සම්බන්ධ කරගන්නා ලෙස ඉල්ලීමක් කිරීමට ඒ ප්‍රවාහකයාට අයිතිය තිබිය යුතු ය.

### 46 වන වගන්තිය - අතිරේක අධිකරණ බලය

45 වන වගන්තියේ අදහස් කරන හානි සඳහා වූ නඩු කටයුත්තක්, පැමිණිලිකරුගේ කැමැත්ත පරිදි පාර්ශ්විය රාජ්‍යයන්ගෙන් එක් දේශ සීමාවක් තුළ දී, 33 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි ගිවිසුම්ගත ප්‍රවාහකයාට එරෙහිව නඩු කටයුත්තක් ඉදිරිපත් කරනු ලැබිය හැකි අධිකරණයක් ඉදිරිපිට දී හෝ විද්‍යාමාන ප්‍රවාහකයාගේ නිත්‍ය වාසස්ථානය හෝ එම ප්‍රවාහකයාගේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පවතින්නේ යම් අධිකරණ බලය ඇති ස්ථානයක ද ඒ අධිකරණ බලය දරන ස්ථානයේ අධිකරණය ඉදිරිපිට දී යන දෙයාකාරයෙන් එක් ආකාරයකට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

### 47 වන වගන්තිය - අවලංගු ගිවිසුම් විධිවිධාන

මේ පරිච්ඡේදය යටතේ ගිවිසුම්ගත ප්‍රවාහකයාගේ හෝ විද්‍යාමාන ප්‍රවාහකයාගේ වගකීම්වලට සහනයක් ලබා දීමට හෝ මේ පරිච්ඡේදයට අනුකූලව අදාළ වන්නා වූ වගකීම්වල සීමාවට වඩා අඩුම සීමාවක් නියම කිරීම සඳහා වන යම් ගිවිසුම් විධිවිධාන ශූන්‍ය සහ බලරහිත විය යුතු ය. නමුත් යම් විධිවිධානයක් ශූන්‍ය වීම මගින් මුළු ගිවිසුම ම ශූන්‍ය නොවන අතර, මෙම පරිච්ඡේදයේ විධිවිධානවලට යටත්ව එම ගිවිසුම පැවතිය යුතු ය.

### 48 වන වගන්තිය - ගිවිසුම්ගත සහ විද්‍යාමාන ප්‍රවාහකයන්ගේ අන්‍යෝන්‍ය සම්බන්ධතා

45 වන වගන්තියේ දක්වා ඇති විධිවිධාන පරිදි හැර, ආධාර ලබා ගැනීමේ හෝ වගකීමෙන් නිදහස් වීමේ යම් අයිතියක් ද ඇතුළුව ප්‍රවාහකයන් විසින් ඔවුන් අතරේ පවත්වාගෙන යන අයිතිවාසිකම් සහ බැඳීම් සඳහා මෙම පරිච්ඡේදයේ බලපෑමක් නොවිය යුතු ය.

## VI වන පරිච්ඡේදය

### වෙනත් විධිවිධාන

#### 49 වන වගන්තිය - විධානාත්මක ඉල්ලීම

පාර්ශ්වයන් විසින් හානි සිදුවීමට පෙරාතුව ම එකී හානි සම්බන්ධයෙන් අදාළ කරගත යුතු නීති තීරණය කිරීමේ දී හෝ නැතහොත් අධිකරණ බලය අනුව රීති වෙනස් කිරීමේ දී මේ සම්මුතිය මඟින් දක්වා ඇති රීති උල්ලංඝනය කිරීම සඳහා පාර්ශ්වයන් විසින් සිදු කරනු ලැබුවා වූ ප්‍රවාහන ගිවිසුම්වල සහ සියලු විශේෂ ගිවිසුම්වල ඇතුළත් කරන ලද යම් වගන්තියක් ශූන්‍ය සහ බලරහිත විය යුතු ය.

#### 50 වන වගන්තිය - රක්ෂණය

මේ සම්මුතිය යටතේ ප්‍රවාහකයන්ගේ වගකීම් ආවරණය වන පරිදි, ප්‍රමාණවත් රක්ෂණයක් පවත්වාගෙන යාමට පාර්ශ්වීය රාජ්‍යයන් විසින් ඔවුන්ගේ ප්‍රවාහකයන්ට නියම කරනු ලැබිය යුතු ය. මෙම සම්මුතිය යටතේ ස්වකීය වගකීම ආවරණය කරනු ලබන පරිදි ප්‍රමාණවත් රක්ෂණයක් පවත්වාගෙන යනු ලබන බවට සාක්ෂි ඉදිරිපත් කිරීම සඳහා පාර්ශ්වීය රාජ්‍යයක් විසින් යම් ප්‍රවාහකයකු වෙත නියම කරනු ලැබිය හැකි ය.

#### 51 වන වගන්තිය - විශේෂ අවස්ථානුගත කරුණුවල දී කරනු ලබන ප්‍රවාහනය

ප්‍රවාහන තොරතුරුවලට අදාළ වන 3 වන වගන්තියේ සිට 5 වන වගන්තිය දක්වා වූ විධිවිධාන ද, 7 වන සහ 8 වන වගන්තිවල විධිවිධාන ද ප්‍රවාහකයාගේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වල විෂය පථයෙන් පරිබාහිර වන විශේෂිත අවස්ථානුගත කරුණුවල දී අදාළ නොවිය යුතු ය.

#### 52 වන වගන්තිය - දිනයන් පිළිබඳ අර්ථ නිරූපණය

"දිනයන්" යන යෙදුම මේ සම්මුතියේ භාවිතා කරනු ලබන විට වැඩ කරන දිනයන් නොව ලිත් දිනයන් අදහස් වේ.

## VII වන පරිච්ඡේදය

### අවසාන වගන්තිය

#### 53 වන වගන්තිය - අත්සන් කිරීම, අනුමත කිරීම සහ බලාත්මකභාවයට එළඹීම

1. 1999 මැයි මස 10 වන දින සිට 28 වන දින දක්වා මොන්ට්‍රියල් නගරයේ දී පවත්වන ලද සංතරණ නීති පිළිබඳ ජාත්‍යන්තර සමුළුවට සහභාගි වන රාජ්‍යයන් විසින් 1999 මැයි මස මොන්ට්‍රියල් හි දී අත්සන් කිරීම සඳහා මෙම සම්මුතිය විවෘතව තබනු ලැබිය යුතු ය. 1999 මැයි මස 28 වන දිනට පසුව, මේ වගන්තියේ 6 වන ඡේදයට අනුකූලව එය බලාත්මක වීමට එළඹෙන තෙක් මොන්ට්‍රියල් හි පිහිටි ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ මූලස්ථානයේ දී සියලු රාජ්‍යයන්ට අත්සන් කිරීම සඳහා මෙම සම්මුතිය විවෘතව තබනු ලැබිය යුතු ය.

2. කලාපීය ආර්ථික සහයෝගිතා සංවිධානය විසින් අත්සන් කිරීම සඳහා ද මෙම සම්මුතිය සමරුපීව විවෘතව තබනු ලැබිය යුතු ය. මේ සම්මුතියේ කාර්යයන් සඳහා "කලාපීය ආර්ථික සහයෝගිතා සංවිධානය" යන්නෙන් මේ සම්මුතිය මගින් පාලනය වන ඇතැම් කාරණා සම්බන්ධයෙන් සුදුසුකම් ඇති සහ මේ සම්මුතිය අත්සන් කිරීමට සහ ස්ථිර කිරීමට සහ පිළිගැනීමට, අනුමත කිරීමට හෝ එකතු වීමට, නිසි ලෙස බලය දෙනු ලැබ ඇති කලාපයක ස්වෛරී රාජ්‍යයන් විසින් සංස්ථාපනය කරන යම් සංවිධානයක් අදහස් වේ. මේ සම්මුතියේ "රාජ්‍ය පාර්ශවයක්" හෝ "රාජ්‍ය පාර්ශ්වයන්ට" යන සඳහන 1 වන වගන්තියේ 2 වන ඡේදයේ දී, 3 වන වගන්තියේ 1(ආ) ඡේදයේ දී, 5 වන වගන්තියේ (ආ) ඡේදයේ දී, 23 වන , 33 වන, 46 වන වගන්තිවල සහ 57 වන වගන්තියේ (ආ) ඡේදයේ දී හැර අන්‍යාකාරයකින් කලාපීය ආර්ථික සහයෝගිතා සංවිධානය සඳහා සමානව අදාළ වේ. 24 වන වගන්තියේ කාර්යයන් සඳහා "පාර්ශ්වීය රාජ්‍යයන්ගේ බහුතරයක්" සහ "පාර්ශ්වීය රාජ්‍යයන්ගෙන් තුනෙන් එකක්" යන යෙදුම කලාපීය ආර්ථික සහයෝගිතා සංවිධානය සඳහා අදාළ නොවිය යුතු ය.

3. මේ සම්මුතිය එයට අත්සන් තබා ඇති රාජ්‍යයන් විසින් සහ කලාපීය ආර්ථික සහයෝගිතා සංවිධානය විසින් ස්ථිර කිරීමට යටත් විය යුතු ය.

4. මේ සම්මුතියට අත්සන් නොකරන යම් රාජ්‍යයක් හෝ කලාපීය ආර්ථික සහයෝගිතා සංවිධානයක් ඕනෑම අවස්ථාවක දී සම්මුතිය පිළිගැනීම, අනුමත කිරීම හෝ එකතුවීම කළ හැකි ය.

5. ස්ථිර කිරීමේ, පිළිගැනීමේ, අනුමත කිරීමේ හෝ එකතුවීමේ සාධන පත්‍ර තැන්පතුධාරියා ලෙස මෙයින් නම් කරනු ලබන ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ තැන්පත් කරනු ලැබිය යුතු ය.

6. මේ සම්මුතිය ස්ථිර කිරීම, පිළිගැනීම, අනුමත කිරීම හෝ එකතු වීම සඳහා වන තිස්වන සාධන පත්‍රය තැන්පතුලාභියා වෙත තැන්පත් කරන ලද දිනයට පසුව වූ හැට වන දිනයේ දී එකී සාධන පත්‍රය තැන්පත් කරන රාජ්‍යයන් අතර මෙම සම්මුතිය බලාත්මකභාවයට එළඹිය යුතු ය. කලාපීය ආර්ථික සහයෝගිතා සංවිධාන විසින් තැන්පත් කරන ලද සාධන පත්‍රයක් මේ ඡේදයේ කාර්යයන් සඳහා ගණනය කරනු නොලැබිය යුතු ය.

7. වෙනත් රාජ්‍යයන් සඳහා සහ වෙනත් කලාපීය ආර්ථික සහයෝගිතා සංවිධානය වෙනුවෙන් ස්ථිර කිරීමේ, පිළිගැනීමේ, අනුමත කිරීමේ හෝ එකතුවීමේ සාධන පත්‍ර තැන්පත් කරන දිනයට පසුව දින හැටක දී මේ සම්මුතිය බලාත්මක විය යුතු ය.

8. තැන්පත්ලාභියා විසින් නොපමාව, අත්සන් තැබූ සියලු පාර්ශ්වයන්ට සහ එහි පාර්ශ්වීය රාජ්‍යයන්ට -

(අ) මේ සම්මුතියේ එක් එක් අත්සන් සහ ඒවායේ දින පිළිබඳව;

(ආ) ස්ථිර කිරීමේ, පිළිගැනීමේ, අනුමත කිරීමේ හෝ එකතුවීමේ සාධන පත්‍රවල එක් එක් තැන්පත් කිරීම් සහ ඒවායේ දින පිළිබඳව;

(ඇ) මේ සම්මුතිය බලාත්මකභාවයට එළඹුන දිනය පිළිබඳව;

(ඈ) මේ සම්මුතිය යටතේ දක්වා ඇති වගකීමේ සීමාවල යම් ප්‍රතිශෝධනයක් බලාත්මකභාවයට එළඹෙන දිනය පිළිබඳව;

(ඉ) 54 වන වගන්තිය යටතේ යම් අවසන් කිරීමක් පිළිබඳ ව,

දැනුම් දිය යුතු ය.

**54 වන වගන්තිය - සම්මුතිය අවසන් කරන බව ප්‍රකාශ කිරීම**

1. යම් පාර්ශ්වීය රාජ්‍යයක් විසින් තැන්පතුධාරියා වෙත ලිඛිතව කරනු ලබන දැන්වීමක් මගින් මේ සම්මුතිය අවසන් කරන බව ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

2. අවසන් කරන බවට වන දැන්වීම තැන්පතුධාරියා වෙත ලැබුණ දිනට පසු දින සිට දින එකසිය අසූවක දී එය බලාත්මක වීම ඇරඹිය යුතු ය.

**55 වන වගන්තිය - වෙනත් වෝර්ෂෝ සම්මුති සාධන පත්‍ර සමග පවතින සම්බන්ධතාවය**

1. පොදුවේ පාර්ශ්වීය රාජ්‍යයන්-

(අ) (මෙහි මින්මතු වෝර්ෂෝ සම්මුතිය යනුවෙන් හඳුන්වනු ලබන) 1929 ඔක්තෝබර් මස 12 වන දින වෝර්ෂෝ හි දී අත්සන් කරන ලද ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහනයට අදාළ වන ඇතැම් රීති එකතු කිරීම සඳහා වන සම්මුතියට;

(ආ) 1929 ඔක්තෝබර් මස 12 වන දින දී වෝර්ෂෝ හි දී අත්සන් කරන ලද ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහනයට අදාළ වන ඇතැම් රීති එකතු කිරීම සඳහා වූ සම්මුතිය සංශෝධනය කිරීම පිණිස (මෙහි මින්මතු "හේග් ප්‍රෝටොකෝල්" යනුවෙන් හඳුන්වනු ලබන) 1955 සැප්තැම්බර් මස 28 වන දින හේග් හි දී සිදු කළ ප්‍රෝටොකෝලයට;

(ඇ) ගිවිසුම්ගත ප්‍රවාහකයා නොවන තැනැත්තකු විසින් ඉටු කරනු ලබන ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහනයට අදාළ වන ඇතැම් රීති එක් කිරීම සඳහා වන වෝර්ෂෝ සම්මුතියට අතිරේක වූ (මෙහි මින්මතු "ගුවාඩලජා සම්මුතිය" යනුවෙන් හඳුන්වනු ලබන) 1961 සැප්තැම්බර් මස 18 වන දින ගුවාඩලජා හි දී අත්සන් කරන ලද සම්මුතියට;

(ඈ) 1955 සැප්තැම්බර් මස 28 වන දින හේග් නුවර දී සිදු කරන ලද ප්‍රෝටොකෝලය මගින් සංශෝධනය කරන ලද 1929 ඔක්තෝබර් මස 12 වන දින වෝර්ෂෝ හි දී අත්සන් කරන ලද ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහනයට අදාළ වන ඇතැම් රීති එක් කිරීම සඳහා වූ සම්මුතිය සංශෝධනය කිරීම සඳහා වන (මෙහි මින්මතු "ගෝතමාලා නගර ප්‍රෝටොකෝල්" යනුවෙන් හඳුන්වනු ලබන) 1971 මාර්තු මස 8 වන දින ගෝතමාලා නගරයේ දී අත්සන් කරන ලද ප්‍රෝටොකෝලයට;

(ඉ) හේග් ප්‍රෝටොකෝල් සහ ගෝතමාල නගර ප්‍රෝටොකෝල් යන ප්‍රෝටොකෝල් දෙක මගින් සංශෝධිත හේග් ප්‍රෝටොකෝල් හෝ වෝර්ෂෝ සම්මුතිය මගින් සංශෝධිත වොර්ෂෝ සම්මුතිය සංශෝධනය කිරීම සඳහා (මෙහි මින්මතු "මොන්ට්‍රියල් ප්‍රෝටොකෝල්"

යනුවෙන් හඳුන්වනු ලබන) 1975 සැප්තැම්බර් මස 25 වන දින මොන්ට්‍රියල් හි දී අත්සන් කළ අතිරේක ප්‍රෝටොකෝල් අංක 1 සිට 3 දක්වා සහ මොන්ට්‍රියල් ප්‍රෝටොකෝල් අංක 4 ට,

පාර්ශ්වයක් වීම හේතුවෙන් මේ සම්මුතියේ පාර්ශ්වීය රාජ්‍යයන් අතර; හෝ

2. ඉහත (අ) සිට (ඉ) දක්වා අනු ඡේදවල සඳහන් කරන ලද සාධනපත්‍රවලින් එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක පාර්ශ්වයක් වන්නා වූ පාර්ශ්වීය රාජ්‍යයක් වීම හේතුවෙන් මේ සම්මුතියේ යම් තනි පාර්ශ්වීය රාජ්‍යයක දේශ සීමා තුළ දී,

ජාත්‍යන්තර ප්‍රවාහනයට අදාළ වෙනත් රීති අභිබවා මෙම සම්මුතිය බලපැවැත්විය යුතු ය.

**56 වන වගන්තිය - එක නීති පද්ධතියකට වඩා පවතින රාජ්‍යයන්**

1. මේ සම්මුතියට අදාළ කාරණා සම්බන්ධයෙන් විවිධ නීති පද්ධති පවතින දේශ සීමා ඒකක එකක් හෝ ඊට වැඩි ගණනක් ඇති රාජ්‍යයක් වන විට දී ඒ රාජ්‍ය විසින් මේ සම්මුතිය අත්සන් කරන විට, ස්ථිර කිරීමේ දී, පිළි ගැනීමේ දී, අනුමත කිරීමේ දී හෝ එකතු වීමේ දී එහි සියලු දේශසීමා ඒකකවලට හෝ ඒවායින් එකකට හෝ ඊට වැඩි ගණනකට පමණක් මේ සම්මුතිය අදාළ කළ යුතු බවට ප්‍රකාශ කරනු ලැබිය හැකි අතර, ඕනෑම වේලාවක වෙනත් ප්‍රකාශයක් භාර දීමෙන් මේ ප්‍රකාශය වැඩි දුරටත් වෙනස් කරනු ලැබිය හැකි ය.

2. එවැනි යම් ප්‍රකාශයක් තැන්පතුධාරියාට දැනුම් දෙනු ලැබිය යුතු අතර, සම්මුතිය අදාළ වන දේශසීමා ඒකක පැහැදිලිව ප්‍රකාශ කළ යුතු ය.

3. එවැනි ප්‍රකාශයක් සිදු කර ඇති පාර්ශ්වීය රාජ්‍යයකට අදාළව-

(අ) 23 වන වගන්තියේ "ජාතික ව්‍යවහාර මුදල්වලට" කරන ලද සඳහන් ඒ රාජ්‍යයට අදාළ දේශසීමා ඒකකවල ව්‍යවහාර මුදල්වලට කරන සඳහනක් ලෙස තේරුම් ගනු ලැබිය යුතු ය; සහ

(ආ) 28 වන වගන්තියේ "ජාතික නීතියට" කරන ලද සඳහනක් ඒ රාජ්‍යයේ අදාළ දේශසීමා ඒකකවල නීතියට කරන ලද සඳහනක් ලෙස තේරුම් ගනු ලැබිය යුතු ය.

**57 වන වගන්තිය - වෙන් කර තැබීම්**

පාර්ශ්වීය රාජ්‍යයන් විසින් ඕනෑම වේලාවක, මේ සම්මුතිය,

(අ) ස්වෛරී රාජ්‍යයක් ලෙස ස්වකීය කර්තව්‍යයන් සහ කාර්යයන් සම්බන්ධයෙන් වාණිජමය නොවන කාර්යයන් සඳහා එකී පාර්ශ්වීය රාජ්‍ය විසින් කෙලින්ම ඉටු කරනු ලබන සහ මෙහෙයවනු ලබන ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහනයකට; සහ/හෝ;

(ආ) ඒ රාජ්‍ය විසින් එහි යුධ හමුදා අධිකාරීන් සඳහා ගුවන් යානය ලියාපදිංචි කර හෝ බද්දට දී ඒ අධිකාරිය විසින් හෝ ඒ අධිකාරිය වෙනුවෙන් සම්පූර්ණ ඉඩ ප්‍රමාණය වෙන් කර ඇති පුද්ගලයන්, බඩු සහ ගමන් බඩු ප්‍රවාහනයකට,

අදාළ කර නොගත යුතු බවට තැන්පතුධාරියා අමතා යවනු ලැබිය හැකි නිවේදනයක් මගින් හැර මේ සම්මුතියට කිසිදු වෙන්කර තැබීමක් ඉදිරිපත් කරනු ලැබිය නොහැක.

සාක්ෂිකරුවන් ලෙස නිසි ලෙස බලය දෙන ලද පහත අත්සන් කරන නිල නියෝජිතයන් මේ සම්මුතියට අත්සන් කර ඇත.

එක් දහස් නවසිය අනූනවයේ මැයි මස 28 වන දින ඉංග්‍රීසි, අරාබි, චීන, ප්‍රංශ, රුසියා, සහ ස්පාඤ්ඤ භාෂාවලින් සියලු පාඨයන් සමානව වලංගු වන පරිදි මොන්ට්‍රියල් හි දී සිදු කරන ලදී. මේ සම්මුතිය ජාත්‍යන්තර සිවිල් ගුවන් සංවිධාන ලේඛනාගාරයේ තැන්පත් කර පවත්වාගෙන යා යුතු අතර, එහි සහතික කළ පිටපත් වෝර්ෂෝ සම්මුතියේ, හේග් ප්‍රෝටොකෝලයේ, ගුවාඩලවා සම්මුතියේ, ගෝතමාලා නගර ප්‍රෝටොකෝලයේ සහ මොන්ට්‍රියල් ප්‍රෝටොකෝලයේ සියලු පාර්ශ්වීය රාජ්‍යයන්ට මෙන්ම මේ සම්මුතියේ සියලු පාර්ශ්වීය රාජ්‍යයන්ට තැන්පත්කරු විසින් සම්ප්‍රේෂණය කළ යුතු ය.